මාඕ සේතුං

වර්තමාන තත්වය සහ
අප සතු කර්තව්‍යයෝ

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: පොතට වහල් වීමට විරුද්ධ වන්න
කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ, කොළඹ
පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
පිටු ගණන: 31
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

LIBERATIONBASE

මාඕ සේතුං

වර්තමාන තත්වය සහ අප සතු කර්තව්‍යයෝ

ප්‍රජා ප්‍රකාශකයෝ
කොළඹ
1970

පළමුවැනි මුද්‍රණය: 1968 මාර්තු
දෙවැනි මුද්‍රණය: 1970 ඔක්තෝබර්

ප්‍රකාශකයාගේ සටහන

සහෝදර මාඕ සේතුංගේ වර්තමාන තත්වය සහ අප සතු කර්තව්‍යයෝ නමැති මේ ලිපියේ පළමුවැනි මුද්‍රණයේ සිංහල පරිවර්තනය කරනලද්දේ පීකිං නුවර විදේශ භාෂා මුද්‍රණාලය මගින් 1967දී ප්‍රසිද්ධ කළ මාඕ සේතුංගේ තෝරාගත් කෘති (ඉංග්‍රීසි පරිවර්තනය), IV වැනි කාණ්ඩයේ දෙවැනි මුද්‍රණයෙහි ඇතුළත් ඒ ලිපියේ ඉංග්‍රීසි පරිවර්තනයෙන් ය. මේ දෙවැනි මුද්‍රණයේදී එය තවදුරටත් දියුණු කර ඇත.

ලිපියට යොද තිබෙන හැඳින්වීම ද සටහන් ද එකී ඉංග්‍රීසි පරිවර්තනයෙහි යොද ඇති ඒවා ම ය.

කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 19 දරණ තැන ප්‍රජා ප්‍රකාශකයෝ සමාගමේ සේවයේ නියුක්ත මීගොඩ පතිරණගේ දයානන්ද (මුද්‍රණ ශිල්පියා) විසින් එම ස්ථානයේ පිහිටි ප්‍රජා මුද්‍රණාලයේ මුද්‍රණය කරනලදුව ප්‍රජා ප්‍රකාශකයෝ (ප්‍රකාශකයා) විසින් ප්‍රසිඛ කරනලදී.

LIBERATIONBASE

හැඳින්වීම

මේ වාර්තාව 1947 දෙසැම්බර් 25වැනි දින සිට 28වැනි දින තෙක් උතුරු ශෙන්සි පළාතේ මයිචි උප-පළාතේ යාංචියාකෞ නම් ස්ථානයේදී පවත්වනලද චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ රැස්වීමකට සහෝදර මාඕ සේතුං විසින් ඉදිරිපත් කරනලද්දකි. රැස්වීමට පැමිණීමට බලය ඇති මධ්‍යම කාරක-සභාවේ සාමාජිකයන්ට සහ වෛකල්පික සාමාජිකයන්ට අමතර ව, ශෙන්සි-කාන්සු-නිංසියා දේශසීමා ප්‍රාන්තයේ ත් ශාන්සි-සුයියුආන් දේශසීමා ප්‍රාන්තයේ ත් වගකිවයුතු සහෝදරවරු ද පැමිණ සිටියහ. මේ රැස්වීම මේ වාර්තාව ත් සහෝදර මාඕ සේතුං විසින් ලියනලද ''වර්තමාන ජාත්‍යන්තර තත්වය තක්සේරු කිරීමේ කරුණු වගයක්'' (බලන්න මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං, 1967, IVවැනි කාණ්ඩය, 87-88වැනි පිටු) නැමති තවත් ලිපියකුත් සාකච්ඡා කොට පිළිගත්තේ ය. සහෝදර මාඕ සේතුංගේ වාර්තාව සම්බන්ධයෙන්, රැස්වීමේදී සම්මත වූ තීරණය මෙසේ පැවසී ය: ''මේ වාර්තාව ප්‍රතිගාමී චියාං කායි-ශෙක් පාලක කල්ලිය පෙරළාදැමීමේ ත් නව-ප්‍රජාතන්ත්‍රවාදී චීනය පිහිටුවීමේ ත් මුළු වකවානුව සඳහා දේශපාලන, යුද්ධමය සහ ආර්ථික ක්ෂේත්‍රයන්හි වැඩසටහන වන ලියවිල්ලකි, මුළු පක්ෂය ත් මුළු හමුදුව ත් මේ ලියවිල්ල සහ, ඊට සම්බන්ධ කොට, 1947, ඔක්තෝබර 10වැනි දින ප්‍රසිද්ධ කළ ලියවිලි [එනම්, 'චීන මහජන විමුක්ති හමුදාවේ ප්‍රකාශනය', 'චීන මහජන විමුක්ති හමුදාවේ සටන්පාඨ', 'ප්‍රධාන විනය නීති තුන සහ අවධානය පිණිස කරුණු අට නැවත නිකුත් කිරීම ගැන උපදේශය', 'චීනයේ සංක්ෂේප ඉඩම් නීතිය' සහ 'චීනයේ සංක්ෂේප ඉඩම් නීතිය ප්‍රකාශයට පත්කිරීම ගැන චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ යෝජනාව'] වටා අධික අධ්‍යාපනයක් දීගෙන යා යුත්තාහ, ඒ ලියවිලි දැඩි ලෙස භාවිතාවේ යෙදිය යුත්තාහ. විවිධ ස්ථාන වල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරගෙන යාමේදී වාර්තාවෙහි පණවා ඇති මූලධර්ම වලින් කිසියම් පිටපැනීමක් වේ නම් එය වහා ම හරිගැස්සිය යුතු ය.'' එම රැස්වීමේදී ගත් සෙසු වැදගත් තීරණ මේවා ය;

(1) චීන මහජන විප්ලවවාදී යුද්ධය පූර්ණ ජයග්‍රහණය කරා නොකඩවා ගෙනයාමට හැම පරිශ්‍රමයක් ම දැරිය යුතු බව සහ, විවේක ගැනීමට සහ ජනතාවට අළුත් ප්‍රහාරයක් දීම සඳහා ප්‍රතිසංවිධානය වීමට කාලය ගැනීම පිණිස ඇනහිටවීමේ උපක්‍රම (සාම සාකච්ඡා) පාවිච්චි කිරීමට සතුරාට ඉඩ නො දිය යුතු බව.

(2) අපේ හමුදාව වඩා ත් විශාල ජයග්‍රහණයක් දිනාගත් කල්හි පමණක් සලකා බැලිය යුතු විප්ලවවාදී මධ්‍යම ආණ්ඩුවක් සකස් කිරීම පිණිස කාලය තවම මෝරා නැති බව සහ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රකාශයට පත්කිරීම ඊට ත් වඩා අනාගතයට අයත් ප්‍රශ්නයක් බව.

රැස්වීම පක්ෂය තුළ එවකට පැවති බරවීමේ ගති සහ ඉඩම් ප්‍රතිසංස්කරණයෙහි හා බහුජන ව්‍යාපාරයන්හි ඇතැම් විශේෂිත ප්‍රතිපත්ති ද සවිස්තර ලෙස සාකච්ඡා කළේ ය. මේ සාකච්ඡා වල ප්‍රතිඵල ඊට පසු සහෝදර මාඕ සේතුං විසින් ''පක්-ෂයේ වර්තමාන ප්‍රතිපත්තියේ යම් යම් වැදගත් ප්‍රශ්න ගැන'' නැමති ලිපියෙහි ඉදිරිපත් කරනලදී. (බලන්න, මාඕ සේතුංගේ තෝරාගත් කෘති, ඉංග්‍රීසි මුද්‍රණය, වි. භා. මු., පීකිං, 1967, IVවැනි කාණ්ඩය, 181-89වැනි පිටු.)

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සුචිකරණ දත්ත
කෘතිය: පොතට වහල් වීමට විරුද්ධ වන්න
කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ, කොළඹ
පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
පිටු ගණන: 31
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

LIBERATIONBASE

වර්තමාන තත්වය සහ අප සතු කර්තව්‍යයෝ

I

චීන ජනතාවගේ විප්ලවවාදී යුද්ධය දන් හැරෙන තැනකට එළඹී ඇත. ඒ කියන්නේ, චීන මහජන විමුක්ති හමුදාව, ඇමරිකා එක්සත් ජනපදයේ පස්සෙන් දුවන බල්ලා වන චියාං කායි-ශෙක්ගේ ප්‍රතිගාමී භටයන් දස ලක්ෂ කීපයක් විසින් කළ පහරදීම ගසා පසු-බස්වා, පහරදීමට බැස සිටින බව ය. වර්තමාන යුද්ධයේ මුල් අවුරුද්ද තුළ ම, එනම් 1946 ජූලි සිට 1947 ජූනි තෙක්, මහජන විමුක්ති හමුදාව පෙරමුණු කීපයක ම චියාං කායි-ශෙක්ගේ පහරදීම ගසා පසුබස්වා, ඔහුට ආරක්ෂා වීමේ තත්වය ගන්නට බල කළේ ය. යුද්ධයේ දෙවැනි අවුරුද්දේ මුල් කාර්තුවේ සිට, එනම් 1947 ජූලි–සැප්තැම්බර් සිට, පටන් ගනිමින්, මහජන විමුක්ති හමුදාව ජාතික පරිමාණයකින් පහරදීම කරන්නට වී නිදහස් ප්‍රදේශයන් සම්පූර්ණ-යෙන් ම විනාශ කරන පිණිස යුද්ධය ඒ ප්‍රදේශයන් තුළට දිගට ම ගෙන යාමේ චියාං කායි-ශෙක්ගේ ප්‍රති-විප්ලවවාදී සැලැස්ම කඩා බිඳ දැම්මේ ය. දැන් යුද්ධය ප්‍රධාන වශයෙන් කරන්නේ නිදහස් ප්‍රදේශ වල නො ව කුඕමින්තාං ප්‍රදේශ වල ය; මහජන විමුක්ති හමුදාවේ ප්‍රධාන බලසේනාවන් කුඕමින්තාං ප්‍රදේශ තුළට ම සටන

ගෙන ගොස් ඇත.[1] මේ චීන දේශයෙහි, මහජන විමුක්ති හමුදාව — එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ත් එහි ගැත්තා වන චියැං කායි–ශෙක් පල්හොර මුලේ ත් — ප්‍රති–විප්ලවයේ රෝදය ආපසු කරකවා, එය විනාශයේ මග දිගේ පල්ලමට යවා ඇත, විප්ලවයේ රෝදය ජයග්‍රහණය කරා යන මග දිගේ ඉස්සරහට තල්ලු කර ඇත. මෙය ඉතිහාසයෙහි හැරෙන තැනක් සලකුණු කරයි. එය චියැං කායි–ශෙක්ගේ විසි–අවුරුද්දක ප්‍රති–විප්ලවවාදී පාලනයට වර්ධනයෙන් අභාවයට හැරෙන තැන වේ. එය දනට අවුරුදු සියයකට වඩා පරණ, චීනයෙහි අධිරාජ්‍යවාදී පාලනයට වර්ධනයෙන් අභාවයට හැරෙන තැන වේ. මෙය හාරදූර සිද්ධියකි. එය හාරදූර වන්නේ එය 47 කෝටි 50 ලක්ෂයක ජනගහණයක් සහිත රටක සිදු වන නිසා ය; සිදු වූ කල, එය සත්තකින් ම රට මුළුල්ලෙහි ජයග්‍රහණයෙන් කුළුගැන්වෙන නිසා ය. එමතු නො ව, එය හාරදූර වන්නේ එය මිනිසුන් කෝටි 100ක් — මිනිස්වර්ගයා ගෙන් අඩක් — අධිරාජ්‍යවාදී පීඩනයට යට වී දුක් විඳින පෙරදිග සිදු වන නිසා ය. චීන ජනතාවගේ විමුක්ති යුද්ධය ආරක්ෂාවීමේ තත්වයේ සිට පහරදීමේ තත්වයට හැරීම මේ පීඩිත ජාතීන් ප්‍රීතියට ත් උද්‍යොගයට ත් පත් නො කොට නො හැකි ය. එය යුරෝපයෙහි ත් ඇමරිකාවෙහි ත් බොහෝ රටවල් වල දැන් අරගල කරමින් සිටින පීඩිත ජනයාට ද ආධාරයක් වේ.

II

චියැං කායි–ශෙක් ඔහුගේ ප්‍රති–විප්ලවවාදී යුද්ධය පටන් ගත් ද සිට ම, අප ඔහු පරාජය කළ යුතු බව ත් අපට ඔහු පරාජය කළ හැකි බව ත් අපි කීවෙමු. අප ඔහු පරාජය කළ යුත්තේ ඔහු පටන් ගත් යුද්ධය චීන ජාතියේ ස්වාධීනත්වයට ත් චීන ජනතාවගේ විමුක්තියට ත් විරුද්ධ ව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ විධානය පිට පටන් ගත් ප්‍රති–විප්ලවවාදී යුද්ධයක් නිසා ය. දෙවැනි ලෝක යුද්ධය නිම වූ පසු සහ ජපන් අධිරාජ්‍යවාදය පෙරළාදැමූ පසු, චීන ජනතාව සතු කර්තව්‍යය වූයේ නව–ප්‍රජාතන්ත්‍රවාදී විපර්යාසය දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වශයෙන් සම්පූර්ණ කිරීම ත්, ජාතික එක්සත්බව සහ ස්වාධීනත්වය අත්පත් කර ගැනීම ත්, චීනය කෘෂිකාර්මික රටකින් කර්මාන්තමය රටක් බවට වෙනස් කිරීම ත් ය. එහෙත් ඒ අවස්ථාවේ,

ෆැසිස්ට්–විරෝධී දෙවැනි ලෝක යුද්ධය ජයග්‍රාහී ලෙස නිම වූ පසු, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ත් විවිධ රටවල් වල සිටි එහි ගැත්තෝ ත් ජර්මන් සහ ජපන් අධිරාජ්‍යවාදයේ සහ එහි ගැත්තන්ගේ තැන් වලට රිංගාගෙන, සෝවියට් සංගමයට විරුද්ධ ව, යුරෝපයෙහි මහජන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය වලට විරුද්ධ ව, ධනවාදී රටවල් වල කම්කරු ව්‍යාපාර වලට විරුද්ධ ව, විජිතයන්හි හා අර්ධ–විජිතයන්හි ජාතික ව්‍යාපාර වලට විරුද්ධ ව සහ චීන ජනතාවගේ විමුක්තියට විරුද්ධ ව ප්‍රතිගාමී කඳවුරක් සකස් කළහ. ඒ අවස්ථාවේ චියැං කායි–ශෙක් ප්‍රමුඛ චීන ප්‍රතිගාමීයෝ — වොං චිං–වෙයි ජපන් අධිරාජ්‍යවාදය වෙනුවෙන් කළාක් මෙන් — එක්සත් ජනපද අධිරාජ්‍යවාදය වෙනුවෙන් පස්සෙන් දුවන බල්ලා මෙන් ක්‍රියා කළහ, චීනය එක්සත් ජනපදයට විකුණා දැමූහ, චීන ජනතාවගේ විමුක්තිය ඉදිරියට යාම මැඩලනු පිණිස ඔවුන්ට විරුද්ධ ව යුද්ධයක් මුදා හළහ. ඒ අවස්ථාවේ, අප දුර්වල බවක් පෙන්නුවා නම් හෝ ඉඩ දුන්නා නම් ද, ප්‍රති–විප්ලවවාදී යුද්ධයට විප්ලවවාදී යුද්ධයෙන් විරුද්ධ වීම පිණිස ස්ථිර සිතින් නැඟී සිටීමට එඩිතර වුණේ නැත් නම් ද, චීනය අඳුරු ලොවක් වන්නට ඉඩ තිබුණේ ය, අපේ ජාතියේ අනාගතය කැප වන්නට ඉඩ තිබුණේ ය. චීන කොමියුනිස්ට් පක්ෂය චියැං කායි-ශෙක්ගේ පහරදීමට විරුද්ධ ව දේශප්‍රේමී, යුක්ති සහගත, විප්ලවවාදී යුද්ධයක් ස්ථිර ලෙස කිරීමට චීන මහජන විමුක්ති හමුදාවට නායකත්වය දුන්නේ ය. චීන කොමියුනිස්ට් පක්ෂය, මාක්ස්–ලෙනින්වාද විද්‍යාවේ පදනම මත ජාත්‍යන්තර සහ දේශීය තත්වය ගැන පැහැදිලි හිසින් තක්සේරුවක් කොට, සියරටේ ත් එතෙර ත් ප්‍රතිගාමීන් දෙන සියලු ප්‍රහාරයන් පරාජය කළ යුතු බව ද පරාජය කළ හැකි බව ද වටහා ගත්තේ ය. අඳුරු වලාකුළු අහසෙහි පහළ වූ විට, ඒවා තාවකාලික දෙයක් පමණක් බව ත්, අඳුර ඉක්මනින් පහවී ගොස් ඉර පායන බව ත් අපි පෙන්වා දුනිමු. චියැං කායි–ශෙක් පල්හොර මුල 1946 ජූලියේදී දේශ–ව්‍යාප්ත ප්‍රති–විප්ලවවාදී යුද්ධය දියත් කළ විට, ඔවුන් සිතුවේ මහජන විමුක්ති හමුදාව පරාජය කරන්නට ඔවුන්ට ගත වන්නේ තුන් මසක් හෝ හය මසක් පමණකි කියා ය. හතළිස් ලක්ෂයකට වැඩි ගණනක මුළු යුද්ධමය ශක්තියක් තනන, විසි ලක්ෂයක නිත්‍ය හමුදාවක් ද, නිත්‍ය නො වන භටයන් දස ලක්ෂයකට වැඩි ගණනක් ද, යුද්ධමය සංස්ථාවන්හි සහ පසුබිමෙහි සන්නද්ධ ඒකකයන්හි තවත් මිනිසුන් දස ලක්ෂයක් හෝ ඊට වඩා ද

LIBERATIONBASE

තමන්ට සිටින බව ත්, පහරදීම සඳහා සූදනම් වීම සම්පූර්ණ කිරීමට තමන් කාලය ගෙන තිබුණු බව ත්, මහ නගර වල පාලනය යළි ත් තමන් අතට ගෙන තිබුණු බව ත්, 30 කෝටියකට වැඩි ජනගහනයක් තමන්ට සිටින බව ත්, ජපන් ආක්‍රමණික හටයන් දස ලක්ෂයක් සතු උපකරණ සියල්ල තමන්ට පවරාගෙන තිබුණු බව ත්, එක්සත් ජනපද ආණ්ඩුවෙන් සුවිශාල යුද්ධමය සහ ආර්ථික ආධාර තමන්ට ලැබී තිබුණු බව ත් ඔව්හු ගණනට ගත්හ. මහජන විමුක්ති හමුදව ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධයෙහි යෙදී අට වසක් සටන් කොට වෙහෙසට පත් වී සිටි බව සහ සංඛ්‍යාවන් හා උපකරණ අතින් කුඕමින්තාං හමුදවට වඩා පහළ බව ත්, නිදහස් ප්‍රදේශ වල සිටියේ දස කෝටියකට ටිකක් වැඩි ජනගහනයක් පමණක් බව ත්, මේ ප්‍රදේශ බොහෝවක ප්‍රතිගාමී රදළ බලවේග එතෙක් ම නැති කර දමා නො තිබුණු බව සහ ඉඩම් ප්‍රතිසංස්කරණය එතෙක් ම හැම තැන ම සහ අනූන ලෙස කරගෙන ගොස් නො තිබුණු බව, එනම්, මහජන විමුක්ති හමුදවේ පසුමුණු ප්‍රදේශය එතෙක් ම තහවුරු කර නො තිබුණු බව ත් ඔව්හු එසේ ම ගණනට ගත්හ. මේ තක්සේරුවෙන් පටන් ගෙන ඉදිරියට යමින්, චියාං කායි-ශෙක් පල්හොර මුල සාමය සඳහා චීන ජනතාවගේ අභිලාෂය නො තකා හැරී ය, 1946 ජනවාරියේදී කුඕමින්තාං පක්ෂය ත් කොමියුනිස්ට් පක්ෂය ත් විසින් අත්සන් කරනලද තාවකාලිකව සටන් නතර කිරීමේ ගිවිසුම මෙන් ම සියලු පක්ෂ වල දේශපාලන සාකච්ඡාසභාව විසින් සම්මත කර තිබුණු යෝජනා ද අන්තිමේදී ඉරා දමා, සාහසිකවාදි යුද්ධයක් දියත් කළේ ය. යුද්ධ සේනාවන් අතින් චියාං කායි-ශෙක්ට තිබුණු වැඩි-බලය හුදෙක් අනිස්පීර ය'යි, තාවකාලික කොටසක් පමණක් රඟපෑ හැකි සාධකයක් ය'යි ද, එක්සත් ජනපද අධිරාජ්‍යවාදින් දෙන ආධාර ද එසේ ම තාවකාලික කොටසක් පමණක් රඟපෑ හැකි සාධකයක් ය'යි ද, ඒ එසේ වන අතර චියාං කායි-ශෙක්ගේ යුද්ධයේ ජනතා-විරෝධි ලක්ෂණය හා ජනතාවගේ හැඟීම් නිත්‍ය කොටසක් රඟපාන සාධක වේ ය'යි ද, මේ අතින් මහජන විමුක්ති හමුදව වැඩි බලය ඇති තත්වයක සිටී ය'යි ද අපි ඒ අවස්ථාවෙහි කීවෙමු. ලක්ෂණයෙන් දේශප්‍රෙමී, යුක්ති සහගත සහ විප්ලවවාදි වූ හෙයින්, මහජන විමුක්ති හමුදව කළ යුද්ධය මුළු රටේ ම ජනතාවගේ අනුබලය දිනා ගන්නවා නියත විය. චියාං කායි-ශෙක් ජය ගැනීම සඳහා තිබුණු දේශපාලන අත්තිවාරම එය විය. දහඅට මසක යුද්ධය පිළිබඳ අත්දැකීම අපේ නිගමනය සපුරා සනාථ කර ඇත.

III

සටන් කළ දහහත් මසක් තුළ (එනම් 1946 ජූලි සිට 1947 නොවැම්බර් තෙක්; දෙසැම්බරයේ ගණන් තවම ලැබී නැත), අපි චියාං කායි-ශෙක්ගේ නිත්‍ය සහ නිත්‍ය නො වන හටයන් 16,90,000ක් මැරුවෙමු, තුවාල කළෙමු, අල්ලාගතිමු; — 6,40,000ක් මරනලදහ, හෝ තුවාල කරනලදහ; 10,50,000ක් අල්ලාගන්නාලදහ. එසේ චියාං කායි-ශෙක්ගේ පහරදීම ගසා පසුබස්සන්නට, නිදහස් ප්‍රදේශ වල ප්‍රධාන භූමිප්‍රදේශ රැකගන්නට සහ පහරදීමට බහින්නට අපට හැකි විය. යුද්ධමය අංශයෙන් කතා කරන කල, අපට මෙය කළ හැකි වූයේ අප නිවැරදි උපායමාර්ගය යෙදූ නිසා ය. අපේ සටන් මූලධර්ම මේවා ය:

(1) පළමුකොට විසුරුණු, තනි වූ සතුරු සේනාවන්ට පහර දෙන්න, පසුව එක්රැස් කර සිටින බලවත් සතුරු සේනා-වන්ට පහර දෙන්න.

(2) පළමුකොට කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ නගර ත් පැතුරුණු ගම්බද ප්‍රදේශ ත් අල්ලාගන්න; පසුව ලොකු නගර අල්ලාගන්න.

(3) සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදිය හැකි ශක්තිය මුල්පිස දැමීම අපේ ප්‍රධාන පරමාර්ථය කරගන්න; නගරයක් හෝ ස්ථානයක් අල්ලාගෙන සිටීම හෝ අත්පත් කරගැනීම අපේ ප්‍රධාන පරමාර්ථය නො කරගන්න. නගරයක් හෝ ස්ථානයක් අල්ලාගෙන සිටීම හෝ අත්පත් කරගැනීම සතුරාගේ වහා ම ක්‍රියාවෙහි යෙදිය හැකි ශක්තිය මුල්පිස දැමීමේ ප්‍රතිඵලය වේ; බොහෝ විට නගරයක් හෝ ස්ථානයක් සදහට ම අල්ලා-ගෙන සිටීමට හෝ අත්පත් කර ගැනීමට හැකි වන්නේ එය කීප වරක් අතින් අතට මාරු වූ පසු පමණකි.

(4) හැම සටනකදී ම, (සතුරාගේ ශක්තිය මෙන් දෙ ගුණයක්, තුන් ගුණයක්, සිව් ගුණයක් සහ ඇතැම් විට පස් හෝ හය ගුණයක් පවා ශක්තිමත්) ඒකාන්තයෙන් ම වඩා බලවත්

LIBERATIONBASE

බලසේනාවක් ඒකරාශී කරන්න, සතුරු බලසේනාවන් සම්පූර්ණයෙන් ම වට කරන්න, ඔවුන් නිරවශේෂයෙන් ම මුල්පිස දමන්නට මහන්සි ගන්න, කිසිවකුට දැලෙන් ඔබ්රී යාමට ඉඩ නො දෙන්න. විශේෂ වටාපිටා තත්වයන්හිදී, සතුරාට පොඩිපට්ටම් වන පහරවල් දීමේ ක්‍රමය යොදන්න; ඒ කියන්නේ, වෙනත් සතුරු බලසේනාවන් සුණුවිසුණු කිරීම සඳහා ස්වකීය බළඇණි යුහුව වෙන තැන් වලට ගමන් කරවීමට අපේ හමුදවට හැකි වන සේ, සතුරාගේ එක් කොටසක් මුල්පිස දැමීමේ සහ තවත් කොටසක් පළවා හැරීමේ අරමුණ ඇතිව, සතුරාගේ ඉස්සරහට ම දෙන පහරක් සහ ඔහුගේ අංශ දෙකින් එකකට හෝ දෙකට ම හෝ දෙන පහරක් දීම පිණිස අපේ මුළු ශක්තිය ම එක්රැස් කොට යොදන්න. අපට ලාභයට වඩා අලාභ සිදුවන, නැතහොත් සම සම ව බිඳී යන වැහැරීමේ සටන් වලින් මග අරින්නට මහන්සි ගන්න. මේ අයුරින්, මුළු එකක් වශයෙන් (සංඛ්‍යාවන් අතින්) බලයෙන් අඩු වුව ද, අපි හැම කොටසකදී ත් හැම නියම සටන්ව්‍යාපාරයකදී ත් ඒකාන්තයෙන් ම වඩා බලවත් වන්නෙමු; මෙය සටන්ව්‍යාපාරයේදී ජයග්‍රහණය සහතික කරයි. කල් යන විට, අප මුළු එකක් වශයෙන් වඩා බලවත් වෙනවා ම ය, අන්තිමේදී සියලු සතුරන් මුල්පිස දමනවා ම ය.

(5) සූදනම් නො වී කිසි ම සටනක් නො කරන්න, ජය ගත හැකි බව ඔබට නිසැක නැති කිසි ම සටනක් නො කරන්න; එක් එක් සටන පිණිස හොඳින් සූදනම් ව සිටීමට හැම පරිශ්‍රමයක් ම දරන්න, සතුරා ත්, අප ත් අතර නිශ්චය වශයෙන් පවතින තත්වයන් රැසක් තුළ ජය ගන්නා බව සහතික කිරීමට හැම පරිශ්‍රමයක් ම දරන්න.

(6) අපේ සටන් කිරීමේ පන්නය — එනම් සටනේදී ධෛර්යය, පරිත්‍යාගයට බිය නො වීම, වෙහෙස ගැන බිය නො වීම සහ, දිගට ම සටන් කිරීම (එනම්, කෙටි කාලසීමාවක් ඇතුළත විවේකයක් නොමැතිව පිට පිට ම සටන් කරගෙන යාම) — සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදන්න.

(7) සතුරා ගමනෙහි යෙදී සිටින විට ඔහු මුල්පිස දැමීමට මහන්සි ගන්න; ඒ අතර ම, එක් තැනක රැඳී සිට පහර දීමේ උපක්‍රමයන් කෙරෙහි අවධානය යොමු කරන්න, සතුරාගේ රක්ෂිත ස්ථාන සහ නගර අල්ලාගන්න.

(8) නගර වලට පහර දීම සම්බන්ධයෙන්, දුර්වල ලෙස ආරක්ෂා කර ඇති සියලු සතුරු රක්ෂිත ස්ථාන සහ නගර ස්ථිර ලෙස ම අත්පත් කරගන්න; නිසි මොහොතෙහි, වටාපිටා තත්වයන් ගෙන් අවසර ලැබෙනවා නම්, තරමක ශක්තියක් ඇතිව ආරක්ෂා කර ඇති සියලු සතුරු රක්ෂිත ස්ථාන සහ නගර අත්පත් කර ගන්න. ප්‍රබල ලෙස ආරක්ෂා කර ඇති සතුරු රක්ෂිත ස්ථාන සහ නගර සම්බන්ධයෙන්, තත්වයන් මෝරන තුරු බලා සිට, ඉක්බිති ඒවා ත් අල්ලාගන්න.

(9) සතුරා ගෙන් අල්ලාගත් සියලු අවි වලින් ද පුද්ගලයන් වැඩි ම දෙනා ගෙන් ද අපේ ශක්තිය නැවත තර කරන්න. අපේ හමුදවේ මිනිස්-බලයේ ත් ද්‍රව්‍යොපකරණ වල ත් ප්‍රධාන උල්පත ඇත්තේ යුද පෙරමුණෙහි ය.

(10) විවේක ගැනීමට, පුහුණු වීමට හා අපේ බළඇණි තහවුරු කිරීමට සටන්ව්‍යාපාර අතර විවේක කාලයන් ගෙන් හොඳට ප්‍රයෝජන ගන්න. විවේක ගැනීමේ, පුහුණු වීමේ සහ තහවුරු කිරීමේ කාලසීමා සාමාන්‍යයෙන් ඉතා දිගු නො විය යුතු ය; හැකි තරම් දුරට සතුරාට හුස්ම ගැනීමට කාලයක් නො දිය යුතු ය.

චියාං කායි-ශෙක් පරාජය කිරීමේදී මහජන විමුක්ති හමුදව යෙදූ ප්‍රධාන ක්‍රම මේවා ය. ඒවා අවුරුදු බොහෝ ගණනක් දේශීය හා විදේශීය සතුරන්ට විරුද්ධ ව කළ සටන් වලදී මහජන විමුක්ති හමුදව ලැබූ පන්නරයේ ප්‍රතිඵලය වේ, අපේ වර්තමාන තත්වයට සම්පූර්ණයෙන් සුදුසු වේ. චියාං කායි-ශෙක් පල්හෝර මුල ත් චීනයෙහි සිටින එක්සත් ජනපද අධිරාජ්‍යවාදී යුද්ධමය කාර්යභාරපුද්ගලයෝ ත් අපේ මේ යුද්ධමය ක්‍රම ගැන ඉතා හොඳින් දනිති. ඒවාට ප්‍රතිවිරුද්ධ වීමට මං සොයමින්, චියාං කායි-ශෙක් බොහෝ විට තම සෙනෙවියන් සහ ක්ෂේත්‍ර නිලධාරින් පුහුණුව සඳහා රැස්

LIBERATIONBASE

කොට, යුද්ධයේදී අල්ලාගත් අපේ යුද්ධමය පොතපත සහ ලියකියවිලි ඔවුන්ට අධ්‍යයනය කිරීම සඳහා බෙදු දුන්නේ ය. එක්සත් ජනපද යුද්ධ කාර්යභාරපුද්ගලයන් මහජන විමුක්ති හමුදව විනාශ කරනු පිණිස එක් වර්ගයක උපායමාර්ගයකට හා උපක්‍රම වලට පසු තවත් වර්ගයක උපායමාර්ගයක් සහ උපක්‍රම චියාං කායි-ශෙක්ට අනුමත කර ඇත; ඔවුන් චියාං කායි-ශෙක්ගේ භටසේනාවන් පුහුණු කොට, ඔවුන්ට යුද්ධොපකරණ සපයා ඇත. එහෙත් මේ එක ම පරිශ්‍රමයකට වත් චියාං කායි-ශෙක් පල්හොර මුල පරාජයෙන් බේරා ගන්නට බැරි ය. හේතුව නම් අපේ උපායමාර්ගය සහ උපක්‍රම මහජන යුද්ධයක් පදනම කර ගෙන තිබීම ය; ජනතාවට විරුද්ධ ව සිටින කිසි ම හමුදවකට අපේ උපායමාර්ගය ත් උපක්‍රම ත් පාවිච්චි කළ නො හැකි ය. මහජන යුද්ධයක ත්, හමුදව සහ ජනතාව අතර සමගිය පිළිබඳ, අණදෙන්නන් සහ සටන්කරුවන් අතර සමගිය පිළිබඳ සහ සතුරු භටසේනාවන් කඩ කඩ කොට විසුරුවා හැරීම පිළිබඳ මූලධර්ම වල ත් පදනම මත, මහජන විමුක්ති හමුදව, සතුරා ජය ගැනීමෙහි ලා වැදගත් සාධකයක් වන, ස්වකීය බලසම්පන්න විප්ලවවාදි දේශපාලන වැඩ වර්ධනය කර ඇත. බලයෙන් වැඩි සතුරු සේනාවන් ගෙන් වැදිය හැකි මාරක පහරවල් මග හරිනු පිණිස ත් සතුරා ගමනෙහි සිටින විට ඔහු වැනසීමට අපේ සේනාවන් හරවනු පිණිස ත් අප අපේ ම මුලපිරුමෙන් බොහෝ නගර අත හැර ගිය කල, අපේ සතුරෝ ප්‍රීතියෙන් ඉපිල ගියෝ ය. ඔව්හු මෙය ඔවුන්ගේ ජය ත් අපේ පරාජය ත් ලෙස ගත්හ. ඔව්හු මේ ක්ෂණික ''ජය'' නිසා මන්මත් වූහ. චියාං කායි-ශෙක්, ඔහු චාංචියාකෞ අල්ලාගත් දවසේ පස්වරුවෙහි, ඒ මොහොතේ සිට තම ප්‍රතිගාමී පාලනය තායි කන්ද මෙන් ස්ථාවර වී ය'යි සිතාගෙන, ඔහුගේ ප්‍රතිගාමී ජාතික මන්ත්‍රණසභාව කැඳවීමට අණ කළේ ය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදියෝ ද, දූන් ඉතින් චීනය එක්සත් ජනපද විජිතයක් බවට හැරවීමේ තම වියරු කූට වැඩපිළිවෙල බාධා රහිත ව මුදුන්පත් කළ හැකි ය'යි සිතා ගෙන, ප්‍රීතියෙන් නැටූහ. එහෙත් කාලය ගෙවී යත් ම, චියාං කායි-ශෙක් සහ ඔහුගේ එක්සත් ජනපද ස්වාමිවරු ඔවුන්ගේ තාලය වෙනස් කරන්නට වන්නෝ ය. දූන්, අපේ දේශීය සහ විදේශීය, සියලු සතුරෝ අශුභවාදයෙන් මිරිකී සිටිති. ඔව්හු මහත් සුසුම් හෙළති, අර්බුදයක් ගැන වැළපෙති, තවදුරට ත් ප්‍රීතියේ කිසි ම ලකුණක් නො පළ කරති. ඉකුත් දහඅට මස තුළ, චියාං කායි-

ශෙක්ගේ ඉහළ-පෙළේ අණදෙන්නන් වැඩි ම දෙනා සටන් පැරදුණු හෙයින් ඉවත් කොට වෙන අය පත් කර සිටිති. ඔවුන් අතර ලියු චී (චෙංචව්), ශුඒ යුඒ (සූචව්), වූ චී-වෙයි (උතුරු චියාංසු), තාං එන්-පෝ (දකුණු ශාන්වුං), චෝං චුං-ලියන් (උතුරු හෝනාන්), තු යූ-මිං සහ ශියුං ශි-හුයි (ශෙන්යාං) සහ සුන් ලියන්-චුං (පීපිං) යන අය වෙති. චෙන් චෙං ද චියාං කායි-ශෙක්ගේ මහ සෙනෙවි මණ්ඩලයේ ප්‍රධානයා වශයෙන් සියලු සටන්ව්‍යාපාර වලට විධානය දීම බාරව සිටි ඔහුගේ පදවියෙන් අයින් කොට, ඊසානදිග තනි පෙරමුණක් විධානය කිරීමට පහත දමා සිටී.[2] කෙසේ වෙතත්, තත්වය වෙනස් වූයේ ත්, ඔහුගේ හමුදවන් පහරදීමේ තත්වයේ සිට ආරක්ෂාවීමේ තත්වයට මාරු වූ අතර මහජන විමුක්ති හමුදව ආරක්ෂාවීමේ තත්වයේ සිට පහරදීමේ තත්වයට ගියේ ත් චියාං කායි-ශෙක් ම චෙන් චෙංගේ තැන ගෙන සියලු විධානයන් දීම තමාට පවරා ගෙන සිටි වකවානුවේදී ම ය. මේ වන විට, ප්‍රතිගාමී චියාං කායි-ශෙක් කල්ලියට ත් ඒ කල්ලියේ එක්සත් ජනපද ස්වාමිවරුන්ට ත් ඔවුන්ගේ වරද වැටහී තිබිය යුතු ය. චීන කොමියුනිස්ට් පක්ෂය චීන ජනතාවගේ අභිලාෂයන් නියෝජනය කරමින්, ජපානය යටත් වූ පසු බොහෝ කලක් යන තුරු සාමය සඳහා ත් සිවිල් යුද්ධයට විරුද්ධ ව ත් දැරූ සියලු ප්‍රයත්න ඔවුන් විසින් සලකනලද්දේ බියගුලුකමේ ත් දුබලබවේ ත් ලකුණු ලෙස ය. ඔව්හු තමන්ගේ ශක්තිය පමණට වඩා ලොකු කොට කල්පනා කළහ, විප්ලවයේ ශක්තිය පමණට වඩා සුළු කොට කල්පනා කළහ, ඉවබව නැතිව යුද්ධය මුද හළහ, එසේ තමන් ම අටවාගත් උගුලට අසු වූහ. අපේ සතුරාගේ උපායමාර්ගික ගණන්බැලීම් සම්පූර්ණයෙන් ම ව්‍යර්ථ විය.

IV

මහජන විමුක්ති හමුදවේ පසුමුණු ප්‍රදේශ දූන් මීට දහඅට මසකට උඩදී තිබුණාට වඩා බෙහෙවින් තහවුරු වී ඇත. හේතුව නම් අපේ පක්ෂය, ස්ථිර ලෙස ගොවියන්ගේ පැත්ත ගෙන සිටිමින්, ඉඩම් ප්‍රතිසංස්කරණය කරගෙන ගොස් තිබීම ය. ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලය තුළ, අපේ පක්ෂය, තමාගේ ම මුලපිරුම උඩ ත් කුඔමින්තාං පක්ෂය සමග ජපන්-විරෝධි එක්සත් පෙරමුණ පිහිටුවීම සඳහා සහ ජපන් අධිරාජ්‍යවාදයට විරුද්ධ වෙන්ට

LIBERATIONBASE

එතෙකුත් ඉඩ තිබුණු අය සමග එක්සත් වීම සඳහා ත්, ඉඩම්-හිමියන්ගේ ඉඩම් බලයෙන් අල්ලාගෙන ඒවා ගොවියන් අතර බෙදා දීමේ ස්වකීය පූර්ව-යුද්ධ ප්‍රතිපත්තිය බදු සහ පොලිය අඩු කිරීමේ ප්‍රතිපත්තියක් බවට වෙනස් කළේ ය. මෙය මුළුමනින් ම අවශ්‍ය විය. ජපනුන් යටත් වූ පසු, ගොවියෝ ඉතා ඕනෑකමින් ඉඩම් ඉල්ලා සිටියෝ ය; අපි අපේ ඉඩම් ප්‍රතිපත්තිය බදු සහ පොලිය අඩු කිරීමේ ප්‍රතිපත්තියෙන් ඉඩම්හිමි පංක්තිය සතු ඉඩම් ගොවියන් අතර බෙදා දෙනු පිණිස බලෙන් අල්ලාගැනීමේ ප්‍රතිපත්තිය බවට වෙනස් කිරීමට කාලෝචිත තීරණයක් ගතිමු. 1946, මැයි 4වැනි දින අපේ පක්ෂයේ මධ්‍යම කාරකසභාව නිකුත් කළ නිර්දේශය මේ වෙනස්වීම සලකුණු කළේ ය.[3] 1947 සැප්තැම්බරයෙහි, අපේ පක්ෂය ජාතික ඉඩම් සාකච්ඡාසභාව කැඳවා, චීනයේ සංක්ෂේප ඉඩම් නීතිය[4] කෙටුම්පත් කළේ ය; එය සියලු ප්‍රදේශයන්හි වහා ම ක්‍රියාවට නඟනු ලැබී ය. මේ පියවර ගිය අවුරුද්දේ "මැයි 4 නිර්දේශයෙහි" ඉදිරිපත් කළ ප්‍රතිපත්තිය යළි ත් ස්ථිර කළා පමණක් නො ව, ඒ නිර්දේශයෙහි වූ එක්තරා අනූනභාවයෙන් තොර ගතියක් ද පැහැදිලි ලෙස නිවැරදි කළේ ය. සංක්ෂේප ඉඩම් නීතිය, රදළ සහ අර්ධ-රදළ සූරාකෑමේ ඉඩම් ක්‍රමය නැති කර දැමීම ත් වගා කරන්නන්ට ඉඩම් දීමේ ක්‍රමය ක්‍රියාවේ යෙදීම ත් පිළිබඳ ප්‍රතිපත්තියේ පදනම මත, එක් එක්කෙනාට සම සම ව ඉඩම් බෙදා දීමට කටයුතු සලසයි.[5] මෙය රදළ ක්‍රමය ඉතා ම අනූන ලෙස නැති කර දමන්නාවූ ද චීනයේ ගොවියන් අතර පුළුල් සමූහයන්ගේ ඉල්ලීම් සපුරා ඉටු කරන්නාවූ ද ක්‍රමයකි. ඉඩම් ප්‍රතිසංස්කරණය ස්ථිර ලෙස ත් අනූන ලෙස ත් කරගෙන යාම පිණිස, ගම් වල, ප්‍රතිසංස්කරණය කරගෙන යාමේ නීත්‍යනුකූල බලමණ්ඩල වශයෙන්, ගොවි කුලීකරුවන්, දිළිඳු ගොවියන් සහ මැද ගොවියන් ද ඔවුන් විසින් තෝරාපත් කළ කොමිටි ද ඇතුළු ව, ඉතා ම පුළුල් බහුජන පදනමක් මත ගොවි සංගම් පමණක් නො ව, සියල්ලට ම පෙර දිළිඳු ගොවියන් සහ ගොවි කුලිකරුවන් ගෙන් ද ඔවුන් විසින් තෝරාපත් කළ කොමිටි වලින් ද සැදුණු දිළිඳු ගොවි සමාජ ත් සංවිධානය කිරීම අවශ්‍ය ය; මේ දිළිඳු ගොවි සමාජ සියලු ම ගම්බද අරගල වල නායකත්වයේ කොඳුඇටය විය යුතු ය. ඉඩම්හිමි පංක්තිය විසිනුත් පරණ-තාලේ පොහොසත් ගොවියන් විසිනුත් කරන රදළ සහ අර්ධ-රදළ සූරා-කෑමේ ක්‍රමය නැති කරදැමීම පිණිස දිළිඳු ගොවියන් මත හේත්තු

LIBERATIONBASE

වීම ත් මැද ගොවියන් සමග දැඩි ලෙස එක්සත් වීම ත් අපේ ප්‍රතිපත්තිය වේ. ඉඩම්හිමියන්ට හෝ පොහොසත් ගොවියන්ට ගොවි බහුජනයාට දෙනවාට වඩා ඉඩම් සහ දේපොළ වෙන් කර නො දිය යුතු ය. එහෙත් 1931-34 කාලයේ ගෙනගිය, "ඉඩම් හිමියන්ට ඉඩම් කොහෙත් ම නොදීමේ සහ පොහොසත් ගොවියන්ට නිසරු ඉඩම් දීමේ" අති-වාම ප්‍රතිපත්තිය නැවත ත් ඇති නො විය යුතු ය. ගම්බද ජනගහනයෙහි ඉඩම්හිමියන් සහ පොහොසත් ගොවියන් සිටින ප්‍රමාණය ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන නමුදු, එය සාමාන්‍යයෙන් (පවුල් වශයෙන්) සියයට 8 ක් පමණ වේ; ඒ අතර ඔවුන්ට අයිති ව තිබෙන ඉඩම් ප්‍රමාණය සියලු ම ඉඩම් වලින් සියයට 70 සිට 80 තෙක් වේ. එහෙයින් අපේ ඉඩම් ප්‍රති-සංස්කරණයේ ඉලක්ක ඉතා සුළු ගණනක් වන අතර, ඉඩම් ප්‍රතිසංස්-කරණය සඳහා එක්සත් පෙරමුණට සහභාගි විය හැකි සහ විය යුතු ගම් වල මිනිස්සු බොහෝ වෙති — (පවුල් වශයෙන්) සියයට 90ට ත් වැඩි ය. මෙහිදී මූලික ප්‍රතිපත්ති දෙකක් පිළිපැදිය යුතු ය. පළමු-කොට, දිළිඳු ගොවියන්ගේ ත් ගොවි කුලිකරුවන්ගේ ත් ඉල්ලීම් ඉටු කළ යුතු ය; ඉඩම් ප්‍රතිසංස්කරණයෙහි ඉතා ම මූලික කර්තව්‍යය මෙය වේ. දෙවැනි ව, මැද ගොවියන් සමග දැඩි සමගිය තිබිය යුතු ය, ඔවුන්ගේ පලප්‍රයෝජන වලට හානි නො කළ යුතු ය. අප මේ මූලික ප්‍රතිපත්ති දෙක ග්‍රහණය කරගෙන සිටින තෙක්, ඉඩම් ප්‍රතිසංස්කරණයේදී අප සතු කර්තව්‍යයන් සාර්ථක ලෙස කරගෙන යන්නට සත්තකින් ම අපට හැකි ය. සම සම ව බෙදා දීමේ ප්‍රති-පත්තිය යටතේ, පරණ-තාලේ පොහොසත් ගොවියන්ගේ අතිරික්ත ඉඩම් සහ දේපොළ වලින් කොටසක් බෙදා දීම පිණිස භාර දිය යුතු හේතුව, චීනයෙහි පොහොසත් ගොවියන්ට සාමාන්‍ය වශයෙන් ද විශාල ප්‍රමාණයකට ද රදළ සහ අර්ධ-රදළ සූරාකන්නන්ගේ ලක්ෂණය තිබීම ය; ඔවුන් අතර ඉතා ම වැඩි දෙනා ඉඩම් බදු දෙති, ගිනි පොලියට ණය දෙති; ඔව්හු අර්ධ-රදළ කොන්දේසි පිට ශ්‍රමය කුලියට ගනිති.[6] එමතු නො ව, පොහොසත් ගොවියන්ට වැඩිපුර සහ වඩා හොඳ ඉඩම් තිබෙන නිසා[7], මේ ඉඩම් බෙදා දෙන තුරු දිළිඳු ගොවියන්ගේ ත් ගොවි කුලිකරුවන්ගේ ත් ඉල්ලීම් ඉටු කළ නො හැකි ය. එසේ ද වුව, සංක්ෂේප ඉඩම් නීතිය අනුව, පොහොසත් ගොවියන්ට සාමාන්‍යයෙන් ඉඩම්හිමියන්ට සංග්‍රහ කරනවාට වඩා වෙනස් ලෙස සංග්‍රහ කළ යුතු ය. ඉඩම් ප්‍රතිසංස්-

කරණයේදී මැද ගොවියෝ සම සම ව බෙදීම ගැන කැමැත්ත දක්වති; එයින් ඔවුන්ගේ පලප්‍රයෝජන වලට හානියක් නො වන නිසා ය. සම සම ව බෙදීම යටතේ, මැද ගොවියන් අතර එක් කොටසක ඉඩම් නො වෙනස් ව පවතී; තවත් කොටසක ඉඩම් වැඩි වේ; අතිරික්ත ඉඩම් ස්වල්පයක් ඇත්තේ යමක්කමක් ඇති මැද ගොවියන්ට පමණකි; තමන්ගේ ඉඩම්වලට බදු බර අඩු වන නිසා, ඔව්හු එය සම සම ව බෙදා දීම පිණිස බාර දෙන්නට කැමති වෙති. ඒ එසේ වුව ත්, විවිධ ස්ථාන වල ඉඩම් සම සම ව බෙදා දීම කරන කල, මැද ගොවියන්ගේ අදහස් වලට කන් දීම ත් ඔවුන් විරෝධය පළ කරතොත් ඔවුන්ට සහනයන් දීම ත් අවශ්‍ය ය. රදළ පංක්තියේ ඉඩම් සහ දේපොළ බලයෙන් අල්ලාගෙන බෙදා දීමේදී, ඇතැම් මැද ගොවියන්ගේ අවශ්‍යතාවන්ට සැලකිල්ලක් දැක්විය යුතු ය. පංක්ති තත්වය නිශ්චය කිරීමේදී, මැද ගොවියන් පොහොසත් ගොවියන් සේ වර්ග කිරීමේ වරද නො කරන්නට පරෙස්සම් විය යුතු ය. ක්‍රියාශීලී මැද ගොවියෝ ගොවි සංගම් කොමිටි වල ත් ආණ්ඩුවේ ත් වැඩට ඈද ගත යුත්තාහ. ඉඩම් බද්දේ සහ යුද්ධයට අනුබල දීමේ බර සම්බන්ධයෙන්, සාධාරණ වීමේ සහ හේතු සහගත වීමේ ප්‍රතිපත්තිය පිළිපැදිය යුතු ය. මැද ගොවියන් සමග දැඩි ලෙස එක්සත් වීමේ ස්වකීය උපායමාර්ගික කර්තව්‍යය කරගෙන යාමේදී අපේ පක්ෂය අනුගමනය කළ යුතු විශේෂිත ප්‍රතිපත්ති මේවා ය. ඉඩම් ක්‍රමය අනූන ලෙස ප්‍රතිසංස්කරණය කිරීම වර්තමාන අවස්ථාවේදී චීන විප්ලවයේ මූලික කර්තව්‍යයක් බව මුළු පක්ෂය ම තේරුම් ගත යුතු ය. ඉඩම් ප්‍රශ්නය සර්වව්‍යාපී ලෙස සහ සම්පූර්ණයෙන් විසඳන්නට අපට හැකි නම්, අපේ සියලු සතුරන් පරාජය කරනු පිණිස ඉතා ම මූලික තත්වය අපට ලැබෙනවා ඇත.

V

ඉඩම් ප්‍රතිසංස්කරණය ස්ථිර ලෙස සහ අනූන ලෙස කරගෙන යාම පිණිස ත්, මහජන විමුක්ති හමුදාවේ පසුබිම්ණු ප්‍රදේශ තහවුරු කිරීම පිණිස ත්, අපේ පක්ෂයේ ශ්‍රේණීන්ට අධ්‍යාපනය දීම සහ ඔවුන් ප්‍රතිසංවිධානය කිරීම අවශ්‍ය ය. මුළු එකක් වශයෙන් ගත් කල, ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය පවතින අතර අපේ පක්ෂය තුළ ගෙන ගිය වැරදි හරිගැස්සීමේ ව්‍යාපාරය[8] සාර්ථක විය. එහි

ප්‍රධාන සාර්ථකභාවය වූයේ අපේ නායක මණ්ඩල ද කාඩර්වරුන් හා පක්ෂ සාමාජිකයන් විශාල සංඛ්‍යාවක් ද අප මූලික වශයෙන් යොමුවන අත, එනම් මාක්ස්-ලෙනින්වාදයේ විශ්ව සත්‍යය චීන විප්ලවයේ වාස්තවික භාවිතය සමග සන්ධි කිරීම, ගැන වඩා දැඩි වැටහීමක් ඇති කරගෙන සිටීම ය. මේ අතින් අපේ පක්ෂය විරුද්දකම් පෑමේ යුද්ධයට පෙර සියලු ඉතිහාසීය අවස්ථා හා සසඳන කල ලොකු පියවරක් ඉදිරියට තබා ඇත. කෙසේ වෙතත්, පක්ෂයේ ප්‍රාදේශික සංවිධානයන් තුළ, විශේෂයෙන් ගම්බදපෙදෙස් වල ප්‍රාථමික මට්ටමේ සංවිධානයන් තුළ, අපේ ශ්‍රේණීන්ගේ පංක්ති නිර්මාණයෙහි ත් අප වැඩ කරන විධියෙහි ත් පවතින අපවිත්‍රතා පිළිබඳ ප්‍රශ්නය තව ම විසඳා නැත. 1937තේ සිට 1947 තෙක් එකොළොස් අවුරුද්ද තුළ අපේ පක්ෂයේ සාමාජික පිරිස දස දහස් කීපයක සිට 27,00,000 තෙක් වැඩී ඇත; මෙය ලොකු ඉදිරි පිම්මකි. මෙය අපේ පක්ෂය චීන ඉතිහාසයෙහි අන් කවර පක්ෂයකට ත් වඩා බලවත් පක්ෂයක් කර ඇත. එයින් අපට ජපන් අධිරාජ්‍යවාදය පරාජය කරන්නට, චියැං කායි-ෂෙක්ගේ පහරදීම් ගසා පසු බස්සන්නට, 10 කෝටියකට වැඩි ජනගහනයක් සහිත නිදහස් ප්‍රදේශ වලට නායකත්වය දෙන්නට සහ විසි ලක්ෂයකින් ප්‍රබල මහජන විමුක්ති හමුදාවකට නායකත්වය දෙන්නට හැකි වී තිබේ. එහෙත් අඩුපාඩුකම් ද පැනනැඟී ඇත. බොහෝ ඉඩම්හිමියෝ ත්, පොහොසත් ගොවියෝ ත් රස්තියාදුකාරයෝ ත් අපේ පක්ෂය තුළට පහාරෙන් ම රිංගා ගැනීමට මේ ඉඩප්‍රස්තාව අල්ලාගෙන සිටිති. ගම්බද පෙදෙස් වල ඔව්හු පක්ෂයේ, ආණ්ඩුවේ සහ ජනතාවගේ සංවිධාන ගණනක් ග්‍රහණය කරගෙන සිටිති, තමන්ගේ බලතල අත්තනෝමතික ලෙස වැරදි අන්දමට පාවිච්චි කරති, ජනතාව බිය වද්දමින් හැසිරෙති, පක්ෂයේ ප්‍රතිපත්තිය විකෘති කරති, මෙසේ මේ සංවිධානයන් බහුජනයා ගෙන් ඈත් කරති, ඉඩම් ප්‍රතිසංස්කරණය අඩුපාඩු නැතිව කිරීමට ඉඩ නො දී වළක්වති. මේ බැරෑරුම් තත්වය අපේ පක්ෂයේ ශ්‍රේණීන්ට අධ්‍යාපනය දීමේ ත් ඔවුන් ප්‍රතිසංවිධානය කිරීමේ ත් කර්තව්‍යය අප හට පණවයි. අප මේ කර්තව්‍යය ඉටු කරන තුරු ගම්බදපෙදෙසෙහි ඉදිරියට යන්නට අපට බැරි ය. පක්ෂයේ ජාතික ඉඩම් සාකච්ඡාසභාව මේ ප්‍රශ්නය අනූන ලෙස සාකච්ඡා කොට, උචිත පියවර සහ ක්‍රම පැණවිය. මේවා දැන්, ඉඩම් සම සම ව බෙදා දීම ගැන තීරණය ත් සමග, හැම

LIBERATIONBASE

තැන ම ස්ථිර ලෙස ක්‍රියාවෙහි යොදගෙන යනු ලැබේ. මුලට ම එන්නේ පක්ෂය තුළ විවේචනය ත් ආත්ම–විවේචනය ත් ප්‍රසාරණය කිරීම සහ, පක්ෂ ක්‍රියාමාර්ගයෙන් ඉවත පැනීම් වන, ප්‍රාදේශීය සංවිධානයන් තුළ තිබෙන වැරදි අදහස් හා බැඳුරුම් තත්වයන් අනූන ලෙස එළිදරව් කිරීම ය. පක්ෂයට ත් වැඩකරන ජනතාව අතර ඉතා ම පුළුල් සමූහයන්ට ත් එක ම දිසාවට ගමන් කරන්නට හැකි වන සේ ද, බහුජනයාට ඉදිරියට යාමට නායකත්වය දෙන්නට පක්ෂයට හැකි වන සේ ද, පක්ෂ සංවිධානයන් තුළින් අපවිත්‍රතා ඉවත් කිරීම ත් පක්ෂයේ ශ්‍රේණීන්ට අධ්‍යාපනය දීම සහ ඔවුන් ප්‍රති–සංවිධානය කිරීම ත් ඉඩම් ප්‍රශ්නය විසඳීමෙහි ලා ද දිගින් දිගට ඇදී යන යුද්ධයට අනුබල ලබා ගැනීම සඳහා ද තීරණාත්මක පුරුකක් වන බව සියලු පක්ෂ සාමාජිකයෝ වටහා ගත යුත්තාහ.

VI

LIBERATIONBASE

රදළ පංක්තිය සතු ඉඩම් බලෙන් අල්ලාගෙන, ඒවා ගොවියන්ට පවරා දෙන්න. චියාං කායි–ශෙක්, ටී.වී. සූං, එච්.එච්. කූං සහ චෙන් ලි–පූ යන මොවුන්ගේ ප්‍රමුඛත්වය ලබන ඒකාධිකාරි ප්‍රාග්ධනය බලෙන් අල්ලාගෙන, එය නව–ප්‍රජාතන්ත්‍රවාදි රජයට පවරා දෙන්න. ජාතික ධනේශ්වරපංක්තිය සතු කර්මාන්ත සහ වාණිජ්‍යය ආරක්ෂා කරන්න. මේවා නව–ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවයේ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති තුන වේ. ඔවුන්ගේ විසි–අවුරුදු පාලන කාලය තුළ, චියාං, සූං, කූං සහ චෙන් යන මහ පවුල් හතර එක්සත් ජනපද ඩොලර් කෝටි දහසක සිට දෙදහස තෙක් වටිනා ඉමහත් ධනසම්භාරයක් රැස් කරගෙන, මුළු රටේ ම ආර්ථික ජීවනාලි ඒකාධිකාරයක් කරගෙන සිටිති. මේ ඒකාධිකාර ප්‍රාග්ධනය, රාජ්‍ය බලය හා බද්ධ වී, රාජ්‍ය–ඒකාධිකාර ධනවාදය වී ඇත්තේ ය. මේ ඒකාධිකාර ධනවාදය, විදේශීය අධිරාජ්‍යවාදය ත් දේශීය ඉඩම්හිමි පංක්තිය සහ පරණ–තාලේ පොහොසත් ගොවියනුත් හා සමග කිට්ටුවෙන් බැඳී, කොම්ප්‍රදෝරු, රදළ, රාජ්‍ය–ඒකාධිකාරි ධනවාදය වී ඇත්තේ ය. චියාං කායි–ශෙක්ගේ ප්‍රතිගාමී පාලනයේ ආර්ථික පදනම එබඳු ය. මේ රාජ්‍ය–ඒකාධිකාර ධනවාදය කම්කරුවන් සහ ගොවියන් පමණක් නො ව නාගරික සුළු ධනේශ්වරපංක්තිය ද පෙළයි; එය මැද ධනේශ්වරපංක්තියට හානි කරයි. මේ රාජ්‍ය–

ඒකාධිකාර ධනවාදය විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලයේ ත් ජපනුන් යටත් වූ පසු ත් එහි වර්ධනයේ ඉහළ ම පෙත්තට ළඟා විය; එය නව–ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවය සඳහා ඕනෑ තරම් ද්‍රව්‍යමය තත්වයන් සූදනම් කර ඇත. මේ ප්‍රාග්ධනය චීනයෙහි නිලධාරි–ප්‍රාග්ධනය වශයෙන් මහජනයා අතර ප්‍රකට ය. නිලධාරි–ධනපති පංක්තිය වශයෙන් ප්‍රකට මේ ධනපති පංක්තිය චීනයේ මහ ධනේශ්–වරපංක්තිය වේ. චීනයෙහි අධිරාජ්‍යවාදයට තිබෙන විශේෂ වරප්‍රසාද නැති කර දැමීම හැරුණු කල, සියරටෙහි නව–ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවය සතු කර්තව්‍යය නම් ඉඩම්හිමි පංක්තිය ත් නිලධාරි–ධනපති පංක්තිය (මහ ධනේශ්වරපංක්තිය) ත් විසින් කරනු ලබන සූරාකෑම සහ පෙළීම නැති කර දැමීම, නිෂ්පාදනයේ කොම්ප්‍රදෝරු, රදළ සබඳකම් වෙනස් කිරීම සහ නිෂ්පාදක බලවේගයන් නිදහස් කිරීම ය. ඉඩම්හිමියන් සහ මහ ධනේශ්වරපංක්තිය විසින් ද, ඔවුන්ගේ රාජ්‍ය බලය විසින් ද පෙළනු සහ හානි කරනු ලබන ඉහළ සුළු ධනේශ්වර–පංක්තිය ත් මැද ධනේශ්වරපංක්තිය ත්, තමන් ද ධනේශ්වර වන නමුත්, නව–ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවයට සහභාගි වන්නට හෝ මධ්‍යස්ථ ව සිටින්නට හෝ ඉඩ තිබේ. ඔවුන්ට අධිරාජ්‍යවාදය සමග බැඹී නැත, ඇතත් සන්සන්දනාත්මක වශයෙන් ටිකකි; ඔව්හු නියම ජාතික ධනේශ්වරපංක්තිය වෙති. නව ප්‍රජාතන්ත්‍රවාදයේ රාජ්‍ය බලය ව්‍යාප්ත වන හැම තැන ම, එය ස්ථිර ලෙස ත් නො පැකිළී ත් ඔවුන් ආරක්ෂා කළ යුතු ය. චියාං කායි–ශෙක්ගේ ප්‍රදේශයන්හි, ඉහළ සුළු ධනේශ්වරපංක්තිය සහ මැද ධනේශ්වරපංක්තිය අතර, එම පංක්ති වල දක්ෂිණ අංශය වන, ප්‍රතිගාමී දේශපාලන ප්‍රවණ–තාවන් ඇත්තාවූ ත්, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සහ ප්‍රතිගාමී චියාං කායි–ශෙක් කල්ලිය ගැන මුළාවන් පතුරුවන්නාවූ ත්, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවයට විරුද්ධ වන්නාවූ ත් මිනිස්සු සුළු ගණනක් සිටිති. ඔවුන්ගේ ප්‍රතිගාමී ප්‍රවණතාවන්ට බහුජනයා කෙරෙහි බලපෑමක් කරන්නට යම් තාක් කල් හැකි වේ ද, එතෙක් අපි ඔවුන්ගේ දේශපාලන බලපෑම යටතේ සිටින ජනතාව ඉදිරියෙහි ඔවුන්ගේ වෙස්මුහුණු ගැලවිය යුත්තෙමු, මේ බලපෑමට පහර දී, බහුජනයා එයින් නිදහස් කළ යුත්තෙමු. එහෙත් දේශපාලන වශ–යෙන් පහර දීම ත් ආර්ථික වශයෙන් විනාශ කර දැමීම ත් වෙනස් කරුණු දෙකකි; අප ඒ දෙක පටලවා ගත්තොත් අප අතින් වැරදි සිදු වෙනවා ඇත. නව–ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවය අරමුණු කරන්නේ

රදළවාදය සහ ඒකාධිකාර ධනවාදය පමණක්, ඉඩම්හිමි පංක්තිය සහ නිලධාරි–ධනපති පංක්තිය (මහ ධනේශ්වරපංක්තිය) පමණක් මුල්පිස දැමීමට ය; සාමාන්‍ය වශයෙන් ධනවාදය, ඉහළ සුළු ධනේශ්වරපංක්තිය හෝ මැද ධනේශ්වරපංක්තිය මුල්පිස දැමීමට නො වේ. චීනය ආර්ථික වශයෙන් නොදියුණු තත්වයක පවතින නිසා, විප්ලවයේ දේශ–ව්‍යාප්ත ජයග්‍රහණයට පසු ව පවා, බොහෝ කලක් යන තුරු, පළල් ඉහළ සුළු ධනේශ්වරපංක්තිය ත් මැද ධනේශ්වරපංක්තිය ත් විසින් නියෝජනය වන ආර්ථිකයේ ධනවාදි කවබණ්ඩයක පැවැත්මට ඉඩ දීම අවශ්‍ය වෙනවා ඇත. ජාතික ආර්ථිකයේ ශ්‍රම භේදයට අනුරූප ව, ජාතික ආර්ථිකයට වැඩදායක වූ මේ ධනවාදි කවබණ්ඩයේ සියලු කොටස් එක්තරා ප්‍රමාණයකට වර්ධනය කිරීම එතෙකුත් උවමනා වෙනවා ඇත. මේ ධනවාදි කවබණ්ඩය එතෙකුත් මුළු ජාතික ආර්ථිකයේ නැති ව බැරි කොටසක් වෙනවා ඇත. මෙහි සඳහන් ඉහළ සුළු ධනේශ්වරපංක්තිය නම් කම්කරුවන් හෝ සහකාරයන් සේවයට ගෙන සිටින සුළු කර්මාන්තහිමියන් සහ වෙළෙන්දෝ ය. ඊට අමතර ව, කම්කරුවන් හෝ සහකාරයන් සේවයට ගෙන නැති ස්වාධීන සුළු හස්තකර්මාන්තකාරයන් සහ වෙළෙන්දෝ විශාල ගණනක් ද සිටිති; ඔවුන් තරයේ ම ආරක්ෂා කළ යුතු බව කිව යුත්තක් නො වේ. රට පුරා ම විප්ලවය ජය ගත් පසු, නව–ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍යයට නිලධාරි–ධනපති පංක්තියෙන් පවරා ගත්තාවූ ත් රටේ ආර්ථික ජීවනාලි පාලනය කරන්නාවූ ත් විශාල රාජ්‍ය ව්‍යවසාය අයත් වෙනවා ඇත, තරමක් දිගු කලකට මූලික වශයෙන් විසුරුණු හා තනි පුද්ගල ආර්ථිකයක් වශයෙන් පවතිනවා ඇති නමුත් පසු ව, අඩියෙන් අඩිය, සමුපකාර–සමිති දෙසට වර්ධනය වීමට මගපෙන්වනු ලැබිය හැකි, රදළවාදයෙන් නිදහස් කළ කෘෂිකාර්මික ආර්ථිකයක් තිබෙනවා ඇත. මේ වටාපිටා තත්වයන් යටතේ මේ සුළු සහ මැද ධනවාදි කවබණ්ඩයන්ගේ පැවැත්ම ත් වර්ධනය ත් නිසා අනතුරක් ඉදිරිපත් නො වේ. ඉඩම් ප්‍රතිසංස්කරණයට පසු ගම්බද ප්‍රදේශ වල නො වැළකිය හැකි ලෙස ම පහළ වන අළුත් පොහොසත් ගොවි ආර්ථිකය සම්බන්ධයෙන් ද එය ම සැබෑ ය. 1931–34 කාලයේ ආර්ථිකයෙහි ඉහළ සුළු ධනේශ්වර සහ මැද ධනේශ්වර කවබණ්ඩයන් කෙරෙහි අපේ පක්ෂය විසින් යොදනලද (පමණට වඩා උසස් ශ්‍රම තත්වයන්, අධික ආදායම් බදු ගණන්, ඉඩම් ප්‍රතිසංස්කරණය කරගෙන යන විට

කර්මාන්තහිමියන්ගේ සහ වෙළඳුන්ගේ පලප්‍රයෝජන අතික්‍රමණය කිරීම සහ, නිෂ්පාදනය වර්ධනය කිරීමේ, ආර්ථික සෞභාග්‍යය දියුණු කිරීමේ, මහජන පලප්‍රයෝජන සහ පෞද්ගලික පලප්‍රයෝජන යන දෙකට ම සැලකිල්ල දක්වීමේ ද ශ්‍රමය ත් ප්‍රාග්ධනය ත් යන දෙකට ම යහපතක් සිදු කිරීමේ ද අරමුණ වෙනුවට, කෙටි–කල්පනාකාරි සහ එක පැත්තකට පමණක් සීමා වූ සංකල්පයක් වන ඊනියා ''කම්කරු ශුභසාධනය'' පිළිබඳ අරමුණ ඇති කර ලීම යන) වැරදි අති–වාම ප්‍රතිපත්ති නැවත ත් යොදන්නට කොහෙත් ම අවසර නො දිය හැකි ය. එවැනි වැරදි නැවත ත් කිරීමෙන් සත්තකින් ම වැඩ කරන බහුජනතාවගේ ත් නව–ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍යයේ ත් පලප්‍රයෝජන වලට හානියක් වෙනවා ඇත. චීනයේ සංක්ෂේප ඉඩම් නීතියේ ව්‍යවස්ථා වලින් එකක් මෙසේ ය: ''කර්මාන්තහිමියන් සහ වෙළඳුන් සතු දේපොළ සහ නීත්‍යනුකූල ජාවාරම් අතික්‍රමණය නො කොට ආරක්ෂා කරනු ලැබේ.'' ''කර්මාන්තහිමියන් සහ වෙළඳුන්'' යන්නෙන් සියලු ම ස්වාධීන සුළු හස්තකර්මාන්තකාරයන් සහ වෙළඳුන් මෙන් ම සුළු සහ මැද ධනපති පුද්ගලයෝ ත් අදහස් වෙති. සම්පිණ්ඩනය කරන කල, නව චීනයේ ආර්ථික නිර්මිතය (1) මූලිකත්වය ගත් කවබණ්ඩය වන, රාජ්‍යසන්තක ආර්ථිකය; (2) අඩියෙන් අඩිය පුද්ගලික ආර්ථිකයකින් සාමූහික ආර්ථිකයකට වර්ධනය වන, කෘෂිකාර්මික ආර්ථිකය සහ, (3) ස්වාධීන සුළු හස්තකර්මාන්තකාරයන්ගේ හා වෙළඳුන්ගේ ආර්ථිකය සහ සුළු සහ මැද පෞද්ගලික ප්‍රාග්ධනයේ ආර්ථිකය යන මේවායින් යුක්ත වෙනවා ඇත. මේවා නව–ප්‍රජාතන්ත්‍රවාදි ජාතික ආර්ථිකයේ සර්වය වන්නේ ය. නව–ප්‍රජාතන්ත්‍රවාදි ජාතික ආර්ථිකයට මගපෙන්වන මූලධර්ම නිෂ්පාදනය වර්ධනය කිරීමේ ත්, ආර්ථික සෞභාග්‍යය දියුණු කිරීමේ ත්, මහජන පලප්‍රයෝජන සහ පෞද්ගලික පලප්‍රයෝජන යන දෙකට ම සැලකිල්ල දක්වීමේ ත්, ශ්‍රමය සහ ප්‍රාග්ධනය යන දෙකට ම යහපතක් කිරීමේ ත් සාමාන්‍ය පරමාර්ථයට කිට්ටුවෙන් ම අනුරූප විය යුතු ය. මේ සාමාන්‍ය පරමාර්ථයෙන් ඉවතට යන කවර මූලධර්මයක්, ප්‍රතිපත්තියක් හෝ පියවරක් වේවා වැරදි ය.

LIBERATIONBASE

VII

මහජන විමුක්ති හමුදුව 1947 ඔක්තෝබරයෙහි ප්‍රකාශනයක් නිකුත් කළේ ය; එය එක් කොටසක මෙසේ පැවසී ය:

> කම්කරුවන්, ගොවියන්, සෙබළුන්, උගතුන් සහ ජාවාරම්හිමියන්, සියලු පීඩිත පංක්ති, සියලු මහජන සංවිධාන, ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂ, සුළු ජාතීන්, එතෙර වැසි චීන ජාතිකයන් සහ වෙනත් දේශප්‍රේමීන් ද එක්සත් කරන්න; ජාතික එක්සත් පෙරමුණක් සාදන්න; ඒකාධිපති චියාං කායි-ශෙක් ආණ්ඩුව පෙරළා දමන්න; ප්‍රජාතන්ත්‍රවාදි සභාග ආණ්ඩුවක් පිහිටුවන්න.

එය මහජන විමුක්ති හමුදුවේ ත් චීන කොමියුනිස්ට් පක්ෂයේ ත් මූලික දේශපාලන වැඩසටහන වේ. මතුපිටින්, අපේ විප්ලවවාදි ජාතික එක්සත් පෙරමුණ වර්තමාන වකවානුවේදී, ජපානයට විරුද්දකම් පෑමේ යුද්ධය පැවති වකවානුව හා සසඳන කල, පටු වී තිබෙන ලෙසක් පෙනෙයි. සත්‍ය කාරණයක් වශයෙන්, අපේ ජාතික එක්සත් පෙරමුණ ඇත්ත වශයෙන් පළල් වී තිබෙන්නේ, චියාං කායි-ශෙක් ජාතියේ පලප්‍රයෝජන එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට විකුණා දමා ජනතාවට විරුද්ධ ව දේශ-ව්‍යාප්ත සිවිල් යුද්ධය දියත් කළ පසු, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ත් ප්‍රතිගාමී චියාං කායි-ශෙක් කල්ලියේ ත් අපරාධ චීන ජනතාව ඉදිරියේ සම්පූර්ණයෙන් හෙළිදරව් කළ පසු, වර්තමාන වකවානුවේදී ම ය. විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලයේ, චියාං කායි-ශෙක් සහ කුඕමින්තාං පක්ෂය එතෙකුත් චීන ජනතාව අතර සම්පූර්ණයෙන් ම අගෞරවයට පත් වී නො සිටියේ ය, නොයෙක් අයුරින් ඔවුන් මුළා කරන්නට එතෙකුත් සමත් විය. දැන් එය වෙනස් ය; ඔවුන් කරන සියලු රැවටිලි ඔවුන්ගේ ම ක්‍රියා වලින් පෙනී ගොස් ඇත, ඔවුන්ට තවදුරට ත් කිසි ම බහුජන අනුගාමිකත්වයක් නැත, ඔව්හු සම්පූර්ණයෙන් ම තනි වී සිටිති. කුඕමින්තාං පක්ෂයට හාත්පසින් ම වෙනස් ලෙස, චීන කොමියුනිස්ට් පක්ෂය නිදහස් ප්‍රදේශ වල ජනතාව අතර ඉතා ම පුළුල් සමූහයන්ගේ විශ්වාසය භුක්ති විඳිනවා පමණක් නො වේ; කුඕමින්තාං ග්‍රහණය යටතේ තිබෙන ප්‍රදේශ වල ත් මහ නගර වල ත් පුළුල් සමූහයන්ගේ අනුබලය ද දිනාගෙන සිටී. 1946දී චියාං කායි-ශෙක්ගේ පාලනය යටතේ සිටි ඉහළ සුළු ධනේශ්වර සහ මැද

ධනේශ්වර උගතුන් අතර කොටසක් එතෙකුත් ඊනියා තුන්වැනි මගක්[9] ගැන අදහස ආදරයෙන් රැක ගෙන සිටියා නම්, මේ අදහස දැන් බංකලොත් වී ඇත. අපේ පක්ෂය අනූන ඉඩම් ප්‍රතිපත්තියක් ක්‍රියාවේ යෙදූ නිසා, එය විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලයේදීටත් වඩා පුළුල් ගොවිජන සමූහයන් මුළු හිතින් දෙන අනුබලය දිනාගෙන සිටී. එක්සත් ජනපද අධිරාජ්‍යවාදී ආක්‍රමණයේ ත්, චියාං කායි-ශෙක්ගේ පීඩනයේ ත් බහුජනයාගේ පලප්‍රයෝජන තරයේ ම ආරක්ෂා කිරීම පිළිබඳ අපේ පක්ෂයේ නිවැරදි ප්‍රතිපත්තියේ ත් ප්‍රතිඵලයක් වශයෙන්, අපේ පක්ෂය චියාං කායි-ශෙක්ගේ ප්‍රදේශ වල කම්කරු පංක්තියේ ද, ගොවියන්ගේ ද, නාගරික සුළු සහ මැද ධනේශ්වරපංක්තියේ ද පුළුල් සමූහයන්ගේ අනුකූලතාව දිනාගෙන සිටී. සාගින්නෙන්, දේශපාලන පීඩනයෙන් සහ, චියාං කායි-ශෙක් ජනතාවට විරුද්ධ ව කරන, ජීවිතය ගෙනයන්ට බැරි දෙයක් කර තිබෙන සිවිල් යුද්ධයෙන් අවුස්සනු ලැබ, බහුජනයා එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට ත් චියාං කායි-ශෙක්ගේ ප්‍රතිගාමී ආණ්ඩුවට ත් විරුද්ධ ව අනවරත අරගල කර ඇත්තාහ; ඔවුන්ගේ මූලික සටන්පාඨ සාගින්නට විරුද්ධ ව ය, මර්දනයට විරුද්ධ ව ය, සිවිල් යුද්ධයට විරුද්ධ ව ය, එක්සත් ජනපදය චීනයේ අභ්‍යන්තර කටයුතු වලට ඇඟිලිගැසීමට විරුද්ධ ව ය. පෙර කිසි කලෙක, විරුද්දකම් පෑමේ යුද්ධයට පෙර කාලයේ හෝ ඒ යුද්ධය පැවති කාලයේදී වත්, ජපනුන් යටත් වූ ළඟදී ම වකවානුවේදී වත්, ඔවුන්ගේ ප්‍රබෝධය එතරම් උසස් මට්ටමකට පැමිණියේ නැත. අපේ නව-ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවවාදි එක්සත් පෙරමුණ දැන් වෙන කවර දට ත් වඩා පළල් වී ඇතැ'යි, තහවුරු වී ඇතැ'යි අප කියන්නේ ඒ නිසා ය. මේ වර්ධනය ඇදී තිබෙන්නේ අපේ ඉඩම් සහ නාගරික ප්‍රතිපත්ති සමග පමණක් නො වේ; එය මුළු දේශපාලන තත්වය සමග — මහජන විමුක්ති හමුදුවේ ජයග්‍රහණයන් සමග, චියාං කායි-ශෙක් පහර දෙන තත්වයෙන් ආරක්ෂා වන තත්වයට හැරීම සමග, මහජන විමුක්ති හමුදුව ආරක්ෂා වන තත්වයෙන් පහර දෙන තත්වයට හැරීම සමග, චීන විප්ලවයේ අළුත් උස් වඩදිය රැල්ලක් පිළිබඳ වකවානුව සමග — කිට්ටුවෙන් ඇඳී ඇත්තේ ය. චියාං කායි-ශෙක්ගේ පාලනය නො වැළැකිය හැකි ලෙස ම විනාශ වීමට තීන්දු වී ඇති බව වටහා ගනිමින්, මිනිස්සු දැන් තම බලාපොරොත්තු චීන කොමියුනිස්ට් පක්ෂය ත් මහජන විමුක්ති හමුදුව ත් මත තබති; මෙය උදක් ම

LIBERATIONBASE

ස්වාභාවික ය. ජනගහනයෙන් ඉමහත් වැඩිපිරිසේ ඉතා ම පුළුල් එක්සත් පෙරමුණ නොමැතිව, චීනයේ නව-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේදී ජය දිනාගැනීමට කොහෙත් ම බැරි වෙනවා ඇත. එමතු නො ව, මේ එක්සත් පෙරමුණ චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ තිබිය යුතු ය. පක්ෂයේ තරසර නායකත්වය නොමැතිව, කිසි ම විප්ලවවාදී එක්සත් පෙරමුණකට ජය දිනාගන්ට බැරි ය. උතුරු යුදගමන 1927දී එහි උච්චස්ථානයට පැමිණි කල, අපේ පක්ෂයේ නායක මණ්ඩලය තුළ සිටි යටත්වීම්වාදියෝ පක්ෂය ගොවි බහුජනයාගේ ත් නාගරික සුළු ධනේශ්වරපංක්තියේ ත් මැද ධනේශ්වරපංක්තියේ ත් නායකත්වය ගැනීම සිය කැමැත්තෙන් ම අතහැර දැම්මෝ ය, වෙසෙසින් සන්නද්ධ සේනාවන්ගේ පක්ෂ නායකත්වය අතහැර දැම්මෝ ය; එසේ විප්ලවයේ පරාජය සිදු කළෝ ය. විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලයෙහි, අපේ පක්ෂය යටත්වීම්වාදින්ගේ අදහස් වලට සමාන අදහස් සමග, ඒ කියන්නේ, කුඕමින්තාං පක්ෂයේ ජනතා-විරෝධී ප්‍රතිපත්ති වලට ඉඩ දීම, බහුජනයාට වඩා කුඕමින්තාං පක්ෂය කෙරෙහි විශ්වාසය තිබීම, බහුජනයා අවදි කොට බහුජන අරගල වලට සම්පූර්ණයෙන් ම ඉඩ දීමට එඩිතර නො වීම, ජපනුන් අල්ලාගෙන සිටි ප්‍රදේශ වල නිදහස් ප්‍රදේශ සහ මහජන හමුදා පළල් කරන්නට එඩිතර නො වීම සහ, විරුද්දකම් පෑමේ යුද්ධයේ නායකත්වය කුඕමින්තාං පක්ෂයේ අතට බාර දීම වැනි අදහස් සමග, සටන් කළේ ය. අපේ පක්ෂය මාක්ස්-ලෙනින්වාදයේ මූලධර්මයන්ට පටහැනි එබඳු දුබල සහ පිරිහුණු අදහස් වලට විරුද්ධ ව ස්ථිර අරගලයක් කළේ ය, "ප්‍රගතිශීලී බලවේග වර්ධනය කිරීම, මැද බලවේග මේ පැත්තට දිනාගැනීම සහ ඇට්ටර බලවේග තනි කිරීම" පිළිබඳ ස්වකීය දේශපාලන ක්‍රියාමාර්ගය ස්ථිර ලෙස ක්‍රියාවේ යෙදුවේ ය, නිදහස් ප්‍රදේශ සහ මහජන විමුක්ති හමුදාව ස්ථිර ලෙස පළල් කළේ ය. එයින් සිදු වූයේ ජපන් අධිරාජ්‍යවාදයේ ආක්‍රමණය පැවති වකවානුව තුළ ඒ අධිරාජ්‍යවාදය පරාජය කරන්නට අපේ පක්ෂය සමත් වීම පමණක් නො වේ; ජපනුන් යටත් වූ පසු චියාං කායි-ශෙක් ඔහුගේ ප්‍රති-විප්ලවවාදී යුද්ධය දියත් කළ වකවානුව තුළ අපේ පක්ෂය චියාං කායි-ශෙක්ගේ ප්‍රති-විප්ලවවාදී යුද්ධයට මහජනයාගේ විප්ලවවාදී යුද්ධයකින් විරුද්ධ වීමේ මගට සන්සුන් ලෙස ත් අලාභහානි නො විඳ ත් මාරු වීමට සහ කෙටි කලක් ඇතුළත ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයන්

දිනාගැනීමට සමත් වීම ද එයින් සහතික විය. පක්ෂයේ සියලු සහෝදරවරු ඉතිහාසයේ මේ පාඩම් තරයේ සිත තබා ගත යුත්තාහ.

VIII

ප්‍රතිගාමී චියාං කායි-ශෙක් කල්ලිය 1946දී ජනතාවට විරුද්ධ ව දේශ-ව්‍යාප්ත සිවිල් යුද්ධය දියත් කළ කල්හි, ඔවුන් මේ අවදනම් වැඩය කරන්නට එඩිතර වූ හේතුව ඔවුන් ඔවුන්ගේ ම වඩා ලොකු යුද්ධමය ශක්තිය කෙරෙහි ම පමණක් නො ව, ප්‍රධාන වශයෙන්, "සුවිශේෂයෙන් ම බලවත්" ය'යි, "ලෝකයේ අසමසම" ය'යි ඔවුන් විසින් සලකනලද, පරමාණු බෝම්බ ත් සහිත එක්සත් ජනපද අධිරාජ්‍යවාදින් කෙරෙහි විශ්වාසය තිබීම ය. එක් අතකින්, අවශ්‍ය දේ වැල නො කැඩී සපයමින් යුද්ධ කටයුතු අතින් ද මුදල් කටයුතු අතින් ද තමන්ගේ උවමනාවන් පිරිමසන්නට එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට හැකි ය'යි ඔව්හු සිතූහ. අනික් අතින්, "එක්සත් ජනපදය ත් සෝවියට් සංගමය ත් අතර යුද්ධයක් ඇති වීම නො වළකිය හැකි ය"යි ද "තුන්වැනි ලෝක යුද්ධයක් ඇති වීම නො වළකිය හැකි ය,"යි ද ඔව්හු වියරු ලෙස සමපේක්ෂණය කළහ. එක්සත් ජනපද අධිරාජ්‍යවාදය කෙරෙහි ඇති මේ ගැතිබව දෙවැනි ලෝක යුද්ධයේ සිට සියලු රටවල් වල ප්‍රතිගාමී බලවේගයන්ගේ පොදු ලක්ෂණය වේ. එය දෙවැනි ලෝක යුද්ධයේදී ලෝක ධනවාදයට වැදුණු පහරවල් වල දරුණුබව පිළිබිඹු කරයි; එය සියලු රටවල් වල ප්‍රතිගාමී බලවේගයන්ගේ දුබලකම, ඔවුන්ගේ සන්ත්‍රාසය සහ ඔවුන්ගේ විශ්වාසය භංග වීම පිළිබිඹු කරයි; එය ලෝක විප්ලවවාදී බලවේගයන්ගේ ශක්තිය පිළිබිඹු කරයි — මේ සියල්ල ම සියලු රටවල් වල ප්‍රතිගාමීන් එක්සත් ජනපද අධිරාජ්‍යවාදින්ගේ අනුබලය මත හේත්තු වීම විනා වෙන ගැලවෙන මගක් නැතැ'යි හඟින්නට සලසයි. එහෙත්, ඇත්ත වශයෙන්, දෙවැනි ලෝක යුද්ධයට පසු එක්සත් ජනපද අධිරාජ්‍යවාදය චියාං කායි-ශෙක් සහ සෙසු රටවල් වල ප්‍රතිගාමීන් සිතන තරම් බලවත් ද? ඔවුන්ට අවශ්‍ය දේ වැල නො කැඩී වගුරුවන්නට ඊට ඇත්ත වශයෙන් ම හැකි ද? නැත, එය එසේ නො වේ. දෙවැනි ලෝක යුද්ධ කාලය තුළ වැඩුණු එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ආර්ථික බලය, අනිස්ථිර වූ ත්

LIBERATIONBASE

දිනෙන් දින හැකිලෙන්නාවූ ත් දේශීය සහ විදේශීය වෙළඳපොළවල් වලට මුහුණ දී සිටී. මේ වෙළඳපොළවල් තව දුරට ත් හැකිලීම නිසා ආර්ථික අර්බුද ඇති වෙනවා ඇත. ඇමරිකා එක්සත් ජනපදයෙහි යුද්ධය නිසා ඇති වූ සරුසාරබව හුදෙක් තාවකාලික විය. ඇමරිකා එක්සත් ජනපදයේ ශක්තිය හුදෙක් මතුපිටට සීමා වූ අනිත්‍ය දෙයක් වේ. සමතයට පත් කළ නො හැකි දේශීය සහ ජාත්‍යන්තර ප්‍රතිවිරෝධයෝ, ගිනිකන්දක් මෙන්, හැම ද ම එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට තර්ජනය කරති. එක්සත් ජනපද අධිරාජ්‍යවාදය මේ ගිනිකන්ද මත වාඩි වී සිටී. මේ තත්වය ලෝකය වහල් කිරීම පිණිස සැලැස්මක් සකස් කිරීමට, යුරෝපයෙහි, ආසියාවෙහි සහ ලෝකයේ වෙනත් කොටස් වල වල් සතුන් මෙන් පිස්සුවෙන් දුව පැන ඇවිදීමට, සියලු රටවල් වල ප්‍රතිගාමී බලවේගයන්, එනම් ඒ රටවල් වල ජනතාවන් විසින් ඉවත දමනලද මිනිස් රොඩුබොඩු, එක්රැස් කිරීමට, සෝවියට් සංගමය ප්‍රමුඛ සියලු ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන්ට විරුද්ධ ව අධිරාජ්‍යවාදී සහ ප්‍රජාතන්ත්‍රවාද-විරෝධී කඳවුරක් තැනීමට සහ, අනාගතයේදී, ඈත කාලයක, කවදා හෝ, ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන් පරාජය කරනු පිණිස තුන්වැනි ලෝක යුද්ධයක් පටන් ගැනීමට තමන්ට හැකි වේවි යන බලාපොරොත්තුවෙන් යුද්ධය සඳහා සූදානම් වීමට එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන් පොළඹවා ඇත. මෙය විකාර සැලැස්මකි. ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයෝ මේ සැලැස්ම පරාජය කළ යුත්තාහ, එය පරාජය කරන්නට සත්තකින් ම ඔවුන්ට හැකි ය. ලෝක අධිරාජ්‍ය-විරෝධී කඳවුරේ ශක්තිය අධිරාජ්‍යවාදී කඳවුරේ ශක්තිය ඉක්මවා ඇත. වඩා බලවත් තත්වයේ සිටින්නේ සතුරා නො ව අපි ය. සෝවියට් සංගමය ප්‍රමුඛ අධිරාජ්‍ය-විරෝධී කඳවුර දැනට ම සකස් වී ඇත. සමාජවාදී සෝවියට් සංගමය අර්බුද වලින් තොර ය, නැඟී යන්නේ ය, ලෝකයේ පුළුල් බහුජන සමූහයන් විසින් ආදරයෙන් රකිනු ලබන්නේ ය; එහි ශක්තිය, අර්බුද වලින් බරපතල ලෙස තර්ජනය කරනු ලබන, වැටීගෙන යන සහ ලෝකයේ පුළුල් බහුජන සමූහයන් විසින් විරෝධය පානු ලබන අධිරාජ්‍යවාදී එක්සත් ජනපදයේ ශක්තිය දැනට ම ඉක්මවා ඇත. යුරෝපයෙහි මහජන ප්‍රජාතන්ත්‍රවාදී රටවල් අභ්‍යන්තර වශයෙන් තමන් තහවුරු කර ගනිමින් ද එකිනෙක සමග එක්සත් වෙමින් ද සිටී. යුරෝපීය ධනවාදී රටවල් වල ජනතාවගේ අධිරාජ්‍ය-විරෝධී බලවේගයෝ, ප්‍රන්සයෙහි ත් ඉතාලියෙහි ත්

බලවේගයන් නායකත්වය ගනිමින්, වර්ධනය වේගෙන යති. එක්සත් ජනපදය ඇතුළේ, දිනක් පාසා වඩ වඩා ශක්තිමත් වේගෙන යන මහජන ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයෝ වෙති. ලතින් ඇමරිකාවේ ජනතාවෝ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට කීකරු වහල්ලු නො වෙති. මුළු ආසියාවෙහි ම ශ්‍රේෂ්ඨ ජාතික විමුක්ති ව්‍යාපාරයක් නැඟී ඇත. අධිරාජ්‍ය-විරෝධී කඳවුරේ සියලු බලවේගයෝ එක්සත් වෙමින් ඉදිරියට තෙරපී යති. යුරෝපීය රටවල් නවයක කොමියුනිස්ට් සහ කම්කරු පක්ෂ ඔවුන්ගේ ප්‍රවෘත්ති බියුරෝව පිහිටුවා, වහල් කිරීම පිණිස වන අධිරාජ්‍යවාදී සැලැස්මට විරුද්ධ ව නැඟී සිටින ලෙස ලෝකයේ ජනතාව වෙත ආයාචනයක් නිකුත් කර ඇත.[10] සටනට කැඳවීමේ මේ හඬ ලෝකයේ පීඩිත ජනතාව ප්‍රබෝධයට පත් කර ඇත, ඔවුන්ගේ අරගලයේ මග සලකුණු කර ඇත, ජයග්‍රහණය කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය තර කර ඇත. එය ලෝක ප්‍රතිගාමිත්වය සන්ත්‍රාසයට ත් වික්ෂිප්තභාවයට ත් ඇද දමා ඇත. පෙරදිග රටවල් වල සියලු අධිරාජ්‍ය-විරෝධී බලවේගයෝ ද එක්සත් විය යුත්තාහ, අධිරාජ්‍යවාදය විසින් ද ඔවුන්ගේ දේශීය ප්‍රතිගාමීන් විසින් ද කරන පීඩනයට විරුද්ධ විය යුත්තාහ, පෙරදිග සියක් කෝටියකට වැඩි පීඩිත ජනයා නිවහල් කිරීම තම අරගලයේ එල්ලය කළ යුත්තාහ. අපි සත්තකින් ම අපේ ඉරණම අපේ ම අතට ගත යුත්තෙමු. අපි අපේ ශ්‍රේණි සියලු දුබල සිතිවිලි වලින් තොර කළ යුත්තෙමු. සතුරාගේ ශක්තිය පමණට වඩා ලොකු කොට ගණන් බලන සහ ජනතාවගේ ශක්තිය පමණට වඩා සුළු කොට ගණන් බලන සියලු අදහස් වැරදි ය. හැම එක්කෙනා ම ආයාශයෙන් පරිශ්‍රම දරතොත්, අපට, ලෝකයේ සියලු ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන් හා එකතු වී, වහල් කිරීම පිණිස වන අධිරාජ්‍යවාදී සැලැස්ම පරාජය කිරීමට, තුන්වැනි ලෝක යුද්ධයක් ඇති වීම වැළැක්වීමට, සියලු ප්‍රතිගාමී පාලනයන් පෙරළා දැමීමට සහ මිනිස් වර්ගයා සඳහා නිත්‍ය සාමය දිනාගැනීමට සත්තකින් ම හැකි ය. අප ඉදිරියට යන මග දිගට නොයෙක් විධියේ බාධක සහ දුෂ්කරතා තවම ත් ඇති වන බව, දේශීය වූ ත් විදේශීය වූ ත් අපේ සියලු සතුරන් පාන වැඩි ම විරුද්දකම් ගැන ත් කරන වියරු අරගල ගැන ත් ක්‍රියා කිරීමට අප සූදානම් ව සිටිය යුතු බව, අපි හොඳින් ම දනිමු. එහෙත් අපට මාක්ස්-ලෙනින්වාද විද්‍යාව ග්‍රහණය කරගෙන සිටින්ට හැකි වන තුරු, බහුජනයා කෙරෙහි විශ්වාසය තිබෙන තුරු, අප බහුජනයා

LIBERATIONBASE

සමග කිට්ටුවෙන් සිටිමින් ඔවුන්ට ඉදිරියට යාමට නායකත්වය දෙන තුරු, කවර බාධකයක් හෝ ජය ගන්නට ත් කවර දුෂ්කරතාවක් හෝ මැඩපවත්වන්නට ත් අපි සම්පූර්ණයෙන් ම සමත් වන්නෙමු. අපේ ශක්තිය අනභිභවනීය වෙනවා ඇත. මෙය ලෝක ධනවාදය ත් අධිරාජ්‍යවාදය ත් ඒවායේ විනාශය කරා පල්ලම් බහින්නාවූ ත් ලෝක සමාජවාදය ත් මහජන ප්‍රජාතන්ත්‍රවාදය ත් ජයග්‍රහණය කරා ගමන් කරන්නාවූ ත් ඓතිහාසික යුගය වේ. උදය ඉදිරියෙහි ඇත, අපි ම වෙහෙසී වැඩ කළ යුත්තෙමු.

1947, දෙසැම්බර් 25

ස ට හ න්

[1] මහජන විමුක්ති හමුදව විවිධ පෙරමුණු වල පිට පිට ම පහර දෙන්නට වී යුද්ධය කුඕමින්තාං ප්‍රදේශයන් තුළට ගෙන ගිය තත්වයෝ සැකෙවින් මෙසේ ය: 1947, ජූනි 30වැනි දින සිට පටන් ගනිමින්, ලියු පෝ-චෙං, තෙං ශියාඕ-පිං සහ වෙනත් සහෝදරවරුන් විසින් නායකත්වය දෙනලද ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් ක්ෂෙත්‍ර හමුදවේ සේනාපේළි 7ක් බලෙන් ම කහ ගඟෙන් එහා පැත්තට ගමන් කොට, තාපියේ කඳු දෙසට තල්ලු වී ගියහ; එසේ මහජන විමුක්ති හමුදවේ උපායමාර්ගික පහරදීම ආරම්භ කළහ. 1948 මාර්තු අවසන් වන විට, සතුරු භටයෝ 100,000ට වඩා මුල්පිස දමන ලදහ; හූපේ-හෝනාන් දේශසීමාවෙහි, බටහිරි අන්හ්වෙයි පළාතෙහි, හූපේ-හෝනාන් දේශසීමාවේ තුංපායි පර්වත ප්‍රදේශයෙහි, යැංසී සහ හැන් ගංගා අතර මිටියාවත් වල සහ වෙනත් තැන් වල අළුත් කඳවුරු ප්‍රදේශ පිහිටුවනු ලැබී ය. චෙන් යී, සූ යූ සහ වෙනත් සහෝදර-වරුන් විසින් නායකත්වය දෙනලද නැගෙනහිර චීන ක්ෂේත්‍ර හමුදවේ සේනාපේළි අටක්, 1947 අගෝස්තුවේදී සතුරා ශාන්ටුං පළාතට දූන් රාශිභූත කළ ප්‍රහාරය සුණුවිසුණු කර දමා, නිරිතදිග ශාන්ටුං පළාතට සහ හෝනාන්-අන්හ්වෙයි-චියාංසු දේශසීමා ප්‍රාන්තයට වේගයෙන් ගමන් කොට, සතුරු භටයන් 100,000ට වඩා මුල්පිස දමූහ, හෝනාන්-අන්හ්වෙයි-චියාංසු නිදහස් ප්‍රදේශ ගොඩනැගූහ, කායිපංහි සහ චෙංචව්හි සතුරාගේ උපායමාර්ගික මධ්‍යස්ථාන තනි කළහ. චෙන් කෙං, ශියේ ෆූ-චි සහ වෙනත් සහෝදරවරුන් විසින් විධානය කරනු ලැබූ ශාන්සි-හෝපෙයි-ශාන්ටුං-හෝනාන් ප්‍රදේශයේ තායියුඒ හමුදවේ සේනාපේළි දෙකක් සහ එක් බළකායයක්, 1947 අගෝස්තුවේදී දකුණු ශාන්සි පළාතේදී බලෙන් ම කහ ගඟෙන් එහා පැත්තට ගමන් කොට, බටහිරි හෝනාන් පළාත තුළට ඉදිරියට ගොස්, සතුරු භටයන් 40,000ට වැඩි ගණනක් මුල්පිස දමූහ, බටහිර හෝනාන් පළාතේ සතුරාගේ උපායමාර්ගික මධ්‍යස්ථානය වූ ලෝයාං සම්පූර්ණයෙන් ම තනි කරමින් ද, තුංකුආන් නුවරට තර්ජනය කරමින් ද හෝනාන්-ශෙන්සි-හූපේ දේශසීමාවෙහි සහ දකුණු ශෙන්සි පළාතෙහි කඳවුරු ප්‍රදේශ ගොඩනැගූහ.

[2] හෝනාන් පළාතේ චෙංචව් නුවර කුඕමින්තාං ආණ්ඩුවේ අස්වැසීමේ මූලස්ථානයේ අධ්‍යක්ෂ වූ ලියු චී 1946 සැප්තැම්බරයෙහි නිරිතදිග ශාන්ටුං පළාතේ තිංතාඕ වල සටන පැරදුණු නිසා 1946 නොවැම්බරයේදී නිලයෙන් පහ කරනලදී. චියාංසු පළාතේ සූචව් නුවර කුඕමින්තාං ආණ්ඩුවේ අස්වැසීමේ මූලස්ථානයේ අධ්‍යක්ෂ වූ ශුඒ යුඒ ඔහුගේ විධානය යටතේ සිටි කුඕමින්තාං භටයන් 1946 දෙසැම්බරයේදී චියාංසු පළාතේ සූචියන් නුවරට උතුරෙන් පිහිටි ප්‍රදේශයෙහි කළ

LIBERATIONBASE

සටන්ව්‍යාපාරයේදී, 1947 ජනවාරියෙහි දකුණු ශාන්තුං වල සටන්ව්‍යාපාරයේදී සහ 1947 පෙබරවාරියෙහි මධ්‍ය ශාන්තුං පළාතෙහි ලායිවූ සටන්ව්‍යාපාරයේදී එක දිගට ම ලැබූ බර පරාජයන් පෙළක් නිසා 1947 මාර්තුවේදී නිලයෙන් පහකරනු ලැබී ය. සූචව් නුවර කුඕමින්තාං ආණ්ඩුවේ අස්වැසීමේ මූලස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වූ වූ චී-වෙයි 1946 දෙසැම්බරයෙහි සූචියන් නුවරට උතුරෙන් පිහිටි ප්‍රදේශයෙහි සටන්ව්‍යාපාරයේදී ලැබූ පරාජය නිසා 1947 මාර්තුවේදී නිලයෙන් පහ කරනු ලැබී ය. කුඕමින්තාං ආණ්ඩුවේ 1වැනි හමුදාවේ අණදෙන්නා වූ තාං එන්-පෝ, 1947 මැයි මාසයෙහි දකුණු ශාන්තුං පළාතේ මෙංලියාංකු වල සටනේදී කුඕමින්තාං ආණ්ඩුවේ ප්‍රතිසංවිධිත 74වැනි ඩිවිසනය මුල්පිස දමනු ලැබූ නිසා, 1947 ජූනි මාසයේදී නිලයෙන් පහ කරනු ලැබී ය. කුඕමින්තාං ආණ්ඩුවේ 4වැනි හමුදාවේ අණදෙන්නා වූ වොං චුං-ලියන්, 1947 ජූලි මාසයෙහි නිරිතදිග ශාන්තුං සටන්-ව්‍යාපාරයේදී ලැබූ පරාජය නිසා 1947 අගෝස්තුවේදී නිලයෙන් පහ කරනු ලැබී ය. ඊසානදිග චීනයේ කුඕමින්තාං ආණ්ඩුවේ සාම සංරක්ෂණ මූලස්ථානයේ අණදෙන්නා වූ තු යූ-මිං ද ඊසානදිග චීනයේ කුඕමින්තාං මහාසේනාධිනායකයාගේ මූලස්ථානයේ අධ්‍යක්ෂ වූ ශියුං ශි-හුයි ද යන දෙදෙනා ම 1947 ජූනියෙහි මහජන විමුක්ති හමුදාවේ ඊසානදිග ග්‍රීෂ්මසෘතු ප්‍රහාරයේදී එම හමුදාව විසින් බරපතල ලෙස පරාජය කරනු ලැබූ නිසා, නිලයෙන් පහ කරනු ලැබූහ. කුඕමින්තාං ආණ්ඩුවේ 11වැනි යුද්ධ කලාපයේ අණදෙන්නා වූ සුන් ලියන්-චුං 1947 ජූනියෙහි ච්ං-ත්සාන් සටන්ව්‍යාපාර-යේදී ත් පාඕතිං නුවරට උතුරෙන් පිහිටි ශුශුයි ප්‍රදේශයෙහි සටන්ව්‍යාපාරයේදී ත් ලැබූ පරාජයන් නිසා, පාඕතිං නුවර අස්වැසීමේ මූලස්ථානයේ අධ්‍යක්ෂ පදවියට පහත දමනු ලැබී ය. චියාං කායි-ශෙක්ගේ මහ සෙනෙවි මණ්ඩලයේ ප්‍රධානයා වූ චෙන් චෙං ඔහු ශාන්තුං පළාතෙහි විධානය කළ සටන්ව්‍යාපාර පිටපිට ම පරාජය වූ නිසා 1947 අගෝස්තුවෙහි ඊසානදිග චීනයේ අග්‍රාණ්ඩුකාර පදවියට පහත දමනු ලැබී ය.

[3] මෙයින් සඳහන් වන්නේ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් 1946, මැයි 4වැනි දින නිකුත් කරනලද "ඉඩම් ප්‍රශ්නය ගැන නිර්දේශය"යි. ජපනුන් යටත් වූ පසු, ගොවියන් මහත් ඕනෑකමින් ඉඩම් ඉල්ලා සිටි නිසා, මධ්‍යම කාරකසභාව විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලයේ තිබුණු ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කිරීමට, ඒ කියන්නේ, බදු සහ පොලී අඩු කිරීමේ ප්‍රතිපත්තිය ඉඩම්හිමියන් සතු ඉඩම් බලෙන් අල්ලාගෙන ඒවා ගොවියන් අතර බෙදා දීමේ ප්‍රතිපත්තිය බවට වෙනස් කිරීමට, තීරණය කළේ ය. "මැයි 4 නිර්දේශය" මේ වෙනස් කිරීම සලකුණු කළේ ය.

[4] චීන කොමියුනිස්ට් පක්ෂයේ ජාතික ඉඩම් සාකච්ඡාසභාව 1947 සැප්තැම්බර් මාසයේදී හෝපෙයි පළාතේ පිංශාන් කෝරළයේ ශිපායිපෝ ගමේදී පවත්වනලදී. සාකච්ඡාසභාව විසින් සැප්තැම්බර් 13 වැනි දින සම්මත කරනලද චීනයේ සංක්ෂේප ඉඩම් නීතිය චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් 1947, ඔක්තෝබර් 10 වැනි ද ප්‍රසිද්ධ කරනලදී. එය මතු දක්වන දේ නියම කළේ ය:

> රදළ සහ අර්ධ-රදළ සූරාකෑමේ ඉඩම් ක්‍රමය නැති කොට වගා කරන්-නන්ට ඉඩම් දීමේ ක්‍රමය ක්‍රියාවේ යොදන්න.

> ගම් වල තිබෙන ඉඩම්හිමියන් සතු ඉඩම් සහ රජයේ ඉඩම් සියල්ල ප්‍රාදේශීය ගොවි සංගම් වලට පවරා ගෙන, එහි තිබෙන සෙසු සියලු ඉඩම් ද සමග, ස්ත්‍රී-පුරුෂභාවය නො තකා මුළු ගම්බද ජනගහණය අතර සම සම ව බෙදිය යුතු ය.

> ගම් වල ගොවි සංගම් ඉඩම්හිමියන් සතු බර අදින සතුන්, ගොවි මෙවලම්, ගෙවල්, ධාන්‍ය සහ වෙනත් දේපොළ පවරා ගෙන, පොහොසත් ගොවියන් සතු එබඳු දේපොළ වලින් අතිරික්ත කොටස් බලෙන් ලබා ගෙන, මේ සියලු දේපොළ ඒවා උවමනා කරන ගොවියන් සහ සෙසු දුප්පත් මිනිසුන් අතර බෙදා දිය යුතු ය, ඉඩම්හිමියන්ට ද ඒ තරම් ම කොටසක් වෙන් කර දිය යුතු ය.

මෙසේ සංක්ෂේප ඉඩම් නීතිය 1946යේ "මැයි 4 නිර්දේශයෙහි" පණවා තිබෙන "ඉඩම්හිමියන් සතු ඉඩම් බලෙන් අල්ලාගැනීමේ සහ ඒවා ගොවියන් අතර බෙදා දීමේ" මූලධර්මය ස්ථිර කළා පමණක් නො ව, ඇතැම් ඉඩම්හිමියන් ගැන පමණට වඩා සැලකිල්ලක් දැක්වූ ඒ නිර්දේශයෙහි තිබුණු අනූනභාවයෙන් තොර බව ද හරිගැස්සුවේ ය.

[5] අනතුරු ව ක්‍රියාත්මක කරගෙන යන අතර චීනයේ සංක්ෂේප ඉඩම් නීතියේ පණවා තිබුණු ඉඩම් සම සම ව බෙදා දීමේ ක්‍රමයෙහි යම් යම් වෙනස්කම් ඇති කරනු ලැබී ය. රදළ ක්‍රමය ඒ වන විට පෙරළා දමා තිබුණු පරණ සහ අඩක් පරණ නිදහස් ප්‍රදේශ වල, කවදුරටත් ඉඩම් සම සම ව බෙදීමක් නො කරනු ලැබේ ය'යි ද, එහෙත් වැඩිපුර තිබෙන අය ගෙන් රැගෙන හිඟයක් තිබෙන අයට දීමේ ත්, වඩා හොඳ ඉඩම් ඇති අය ගෙන් රැගෙන වඩා නරක ඉඩම් ඇති අයට දීමේ ත් ක්‍රමය මගින්, නැවත එකලසක් කිරීම තුළින් එතෙක් රදළ වියගස සම්පූර්ණයෙන් අහකට ඇද දමා නො සිටි දිළිඳු ගොවියන්ට සහ ගොවි කුලීකරුවන්ට, තත්වයන් අනුව අවශ්‍ය වුව හොත්, ඉඩම් සහ සෙසු නිෂ්පාදන මාර්ග එක්තරා ප්‍රමාණයක් දිය යුතු ය'යි ද, ඒ අතර මැද ගොවියන්ට සාමාන්‍ය දිළිඳු ගොවියාට තිබෙනවාට වඩා ඉඩම් තබා ගන්නට ඉඩ දෙනවා ඇතැ'යිද 1948 පෙබරවාරියෙහි චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව ස්වකීය "පරණ සහ අඩක්-පරණ ප්‍රදේශ වල ඉඩම් ප්‍රතිසංස්කරණය ත් පක්ෂය තහවුරු කිරීම ත් පිළිබඳ වැඩය ගැන නිර්දේශයෙහි" පැහැදිලි කළේ ය. රදළ ක්‍රමය එතෙකුත් පැවති ප්‍රදේශ වල, සම සම ව බෙදීම ප්‍රධාන වශයෙන් ඉඩම්හිමියන්ගේ ඉඩම් සහ දේපොළ වලට ත් පරණ-කාලේ පොහොසත් ගොවියන්ගේ අතිරික්ත ඉඩම් සහ දේපොළ වලට ත් සීමා කරනු ලැබී ය. සියලු ප්‍රදේශ වල, නැවත එකලසක් කිරීමේ කාරිය පිණිස මැද ගොවි-යන්ගේ ත් අළුත්-තාලේ පොහොසත් ගොවියන්ගේ ත් අතිරික්ත ඉඩම් සහ දේපොළ ගැනීමට අවසර තිබුණේ එසේ එකලසක් කිරීම ඇත්ත වශයෙන් ම අවශ්‍ය වී නම් සහ අයිතිකරුවන් ඇත්ත වශයෙන් ම කැමැත්ත දුන්නේ නම් පමණකි. අළුත් නිදහස් ප්‍රදේශ වල ඉඩම් ප්‍රතිසංස්කරණයේදී, කිසි ම මැද ගොවියකු ගෙන් කිසි ම ඉඩමක් නො ගත යුතු විය.

[6] චීනයේ ඉඩම් ප්‍රතිසංස්කරණයෙහි පොහොසත් ගොවියන් පිළිබඳ ප්‍රශ්නය ඇගේ විශේෂිත ඉතිහාසීය සහ ආර්ථික තත්වයන් කෙරෙන් පැනනැඟුණු විශේෂ

LIBERATION BASE

එකක් විය. චීනයේ පොහොසත් ගොවියෝ අංග දෙකකින් බොහෝ ධනවාදී රටවල් වල පොහොසත් ගොවියන්ට වෙනස් වූහ. පළමුකොට, ඔවුන්ට සාමාන්‍යයෙන් ද විශාල ප්‍රමාණයකට ද රදළ සහ අර්ධ-රදළ සූරාකන්නන්ගේ ලක්ෂණය තිබුණේ ය; දෙවැනි ව, මේ පොහොසත් ගොවි අර්ථක්‍රමය රටේ කෘෂිකාර්මික අර්ථක්‍රමයෙහි වැදගත් තැනක් නො ගත්තේ ය. චීනයේ ඉඩම්හිමි පංක්තිය විසින් කළ රදළ සූරාකෑමට විරුද්ධ ව කළ අරගලයේදී, දිළිඳු ගොවියන් සහ ගොවි කුලීකරුවන් අතර පුළුල් සමූහයෝ පොහොසත් ගොවියන් කළ රදළ සහ අර්ධ-රදළ සූරාකෑම ද නැති කළ යුතු ය'යි ඉල්ලා සිටියහ. විමුක්ති යුද්ධය පැවති කාලයෙහි, චීන කොමියුනිස්ට් පක්ෂය ගොවියන් අතර බෙදා දීම පිණිස පොහොසත් ගොවියන්ගේ අතිරික්ත ඉඩම් සහ දේපොළ බලෙන් ලබා ගැනීමේ ප්‍රතිපත්තිය පිළිගත්තේ ය, එසේ දිළිඳු ගොවි සහ ගොවි කුලීකරු බහුජනයාගේ ඉල්ලීම් ඉටු කළේ ය, මහජන විමුක්ති යුද්ධයේදී ජයග්‍රහණය සහතික කළේ ය. යුද්ධය ජයග්‍රහණය දෙසට ළඟා වෙමින් යන විට, චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව 1948 පෙබරවාරියේදී අළුත නිදහස් කළ ප්‍රදේශ වල ඉඩම් ප්‍රතිසංස්කරණය පිණිස අළුත් ප්‍රතිපත්ති පැණවී ය. ප්‍රතිසංස්කරණය අවස්ථා දෙකකට බෙදිය යුතු විය: පළමුවැනි අවස්ථාවේදී, පොහොසත් ගොවියන් මධ්‍යස්ථ කිරීම සහ දෙන පහරවල් ඉඩම්හිමියන්ට, මූලික වශයෙන්, මහ ඉඩම්හිමියන්ට යොමු කිරීම; දෙවැනි අවස්ථාවෙහි, ඉඩම්හිමියන්ගේ ඉඩම් බෙදා දෙන අතර, පොහොසත් ගොවියන් බදු ගෙන තිබුණු ඉඩම් සහ ඔවුන්ගේ අතිරික්ත ඉඩම් ද බෙදා දීම; එහෙත් පොහොසත් ගොවියන්ට ඉඩම්හිමියන්ට සංග්‍රහ කරනවාට වඩා වෙනස් ලෙස සංග්‍රහ කිරීම දිගට ම කරගෙන යාම. චීන මහජන සමූහාණ්ඩුව පිහිටුවූ පසු, මධ්‍යම මහජන ආණ්ඩුව 1950දී ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය ප්‍රකාශයට පත් කළේ ය; එය ඉඩම් ප්‍රතිසංස්කරණයේදී කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් බලෙන් පවරා ගත යුත්තේ පොහොසත් ගොවියන් බදු ගෙන තිබුණු ඉඩම් පමණක් ය'යි ද, ඒ අතර ඔවුන් සතු සෙසු ඉඩම් සහ දේපොළ රැක දිය යුතු ය'යි ද පැණවී ය. ඊට අනතුරු ව එළඹුණු සමාජවාදී විප්ලවයේ අවස්ථාවේදී, කෘෂිකාර්මික සමූපකාර ව්‍යාපාරය ගැඹුරු වත් ම සහ ගම්බද අර්ථක්‍රමය වර්ධනය වත් ම පොහොසත් ගොවි අර්ථක්‍රමය අතුරුදහන් විය.

[7] ඒ කියන්නේ, සාමාන්‍ය වශයෙන් පොහොසත් ගොවි පවුලකට දිළිඳු ගොවි පවුලකට වඩා වැඩියෙන් වඩා හොඳ ඉඩම් අයිති ව තිබුණු බව ය. රට මුළු එකක් වශයෙන් ගත් කල, චීනයේ පොහොසත් ගොවියන්ට අයිති වී තිබුණු නිෂ්පාදන මාර්ග ප්‍රමාණය ත් ඔවුන් ගොවිතැනින් නිපද වූ දේ වල පරිමාව ත් ඉතා කුඩා විය. පොහොසත් ගොවි අර්ථක්‍රමය චීනයේ ගම්බද අර්ථක්‍රමයෙහි වැදගත් තැනක් ගත්තේ නැත.

[8] මේ සඳහන චීන කොමියුනිස්ට් පක්ෂය විසින් 1942-43 කාලයේදී පක්ෂය තුළ හැම තැන ම ගෙනගිය වැඩ කරන පන්නයේ වැරදි හරිගැස්සීමේ ව්‍යාපාරය ගැන ය; මනෝමූලවාදය, නිකායවාදය සහ එක අච්චුවේ වක්කළාක් වැනි ලිවීමේ ක්‍රමය යන මේවාට විරුද්ධ ව සටන් කිරීම ඒ ව්‍යාපාරයේ අඩංගු දේ විය. සහෝදර මාඕ සේතුංගේ නායකත්වය යටතේ, මේ වැරදි හරිගැස්සීමේ ව්‍යාපාරය "අතීතයේ

කළ වැරදි නැවත නො කරන සේ ඒ වැරදි වලින් පාඩම් ඉගෙන ගැනීමේ, ලෙඩා බේරා ගැනීමට රෝගය සුව කිරීමේ" ද "සහෝදරවරුන් සමග එක්සත් වන අතර වැරදි සිතීම නැති කර දැමීමේ" ද මූලධර්ම පිළිගත්තේ ය. විවේචනයේ ත් ආත්ම-විවේචනයේ ත් ක්‍රමය මගින්, මේ ව්‍යාපාරය පක්ෂයේ ඉතිහාසයේ නොයෙක් අවස්ථා වල සිදු වී තිබුණු "වාම" සහ දක්ෂිණ වැරදි ඒවායේ මතවාදී මුලට ම හාරා බැලීමෙන් නිවැරදි කළේ ය, පක්ෂ කාඩර්වරුන් අතර පුළුල් ශ්‍රේණි වල මතවාදී මට්ටම බෙහෙවින් උසස් කළේ ය, පක්ෂය තුළ සිතීම මාක්ස්-ලෙනින්වාදයේ පදනම මත එක්සත් කිරීමට බොහෝ සෙයින් ආධාර කළේ ය, මුළු පක්ෂය තුළ උසස් ප්‍රමාණයක සමගියක් ඇති කළේ ය.

[9] මහජන විමුක්ති යුද්ධයේ මුල් අවස්ථාවේදී ඇතැම් ප්‍රජාතන්ත්‍රවාදී පුද්ගලයෝ මහ ඉඩම්හිමියන්ගේ සහ මහ ධනේශ්වරපංක්තියේ කුමන්ත්‍රණ ආඥාදායකත්වය ත් නැතිව, චීන කොමියුනිස්ට් පක්ෂයේ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය ත් නැති ව, ඊනියා තුන්වැනි පාරක් සොයා ගන්නට තමන්ට හැකි වේ ය'යි කල්පනා කළහ. මේ තුන්වැනි පාර ඇත්ත වශයෙන් බ්‍රිතාන්‍ය සහ එක්සත් ජනපද මෝස්තරය අනුව සකස් වූ ධනේශ්වරපංක්තියේ ආඥාදායකත්වය කරා යන පාරක් විය.

[10] කොමියුනිස්ට් සහ කම්කරු පක්ෂ වල ප්‍රවෘත්ති බියුරෝව බල්ගේරියාව, රුමේනියාව, හංගේරියාව, පෝලන්තය, සෝවියට් සංගමය, ප්‍රන්සය, චෙකොස්ලොවැකියාව, ඉතාලිය සහ යුගොස්ලැවියාව යන රටවල් වල කොමියුනිස්ට් සහ කම්කරු පක්ෂ වල නියෝජිතයන් විසින් 1947 සැප්තැම්බරයෙහි පෝලන්තයේ වෝර්සෝ නුවර පැවැත්වූ රැස්වීමකදී ආරම්භ කරනු ලැබී ය. පසුව, 1918 ජූනියෙහි රුමේනියාවේ පැවැත්වූ රැස්වීමකදී, බියුරෝව යුගොස්ලැව් කොමියුනිස්ට් පක්ෂය ස්වකීය මාක්ස්-ලෙනින්වාද-විරෝධී මග අතනැර ගෙන සිටි නිසා ත් සෝවියට් සංගමයට සහ සමාජවාදී කඳවුරට විරුද්ධ ආකල්පයක් ගෙන සිටි නිසා ත් එම පක්ෂය නෙරපූ බව ප්‍රකාශයට පත් කළේ ය. සහෝදර මාඕ සේතුං විසින් මෙහි මතක් කර තිබෙන වහල් කිරීමේ අධිරාජ්‍යවාදී සැලැස්මට විරුද්ධ ව නැඟී සිටින ලෙස ප්‍රවෘත්ති බියුරෝව ලෝකයේ ජනතාවට කළ ආයාචනය ප්‍රවෘත්ති බියුරෝව විසින් 1947 සැප්තැම්බර රැස්වීමේදී සම්මත කරනලද "ජාත්‍යන්තර තත්වය ගැන ප්‍රකාශය" වේ.

LIBERATIONBASE

සටන්ව්‍යාපාරයේදී, 1947 ජනවාරියෙහි දකුණු ශාන්ටුං වල සටන්ව්‍යාපාරයේදී සහ 1947 පෙබරවාරියෙහි මධ්‍ය ශාන්ටුං පළාතෙහි ලායිවු සටන්ව්‍යාපාරයේදී එක දිගට ම ලැබූ බර පරාජයන් පෙළක් නිසා 1947 මාර්තුවේදී නිලයෙන් පහකරනු ලැබී ය. සූචව් නුවර කුඔමින්තාං ආණ්ඩුවේ අස්වැසීමේ මූලස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වූ වූ චි-වෙයි 1946 දෙසැම්බරයෙහි සූචියන් නුවරට උතුරෙන් පිහිටි ප්‍රදේශයෙහි සටන්ව්‍යාපාරයේදී ලැබූ පරාජය නිසා 1947 මාර්තුවේදී නිලයෙන් පහ කරනු ලැබී ය. කුඔමින්තාං ආණ්ඩුවේ 1වැනි හමුදාවේ අණදෙන්නා වූ තාං එන්-පෝ, 1947 මැයි මාසයෙහි දකුණු ශාන්ටුං පළාතේ මෙංලියාංකු වල සටනේදී කුඔමින්තාං ආණ්ඩුවේ ප්‍රතිසංවිධිත 74වැනි ඩිවිසනය මුල්පිස දමනු ලැබූ නිසා, 1947 ජූනි මාසයේදී නිලයෙන් පහ කරනු ලැබී ය. කුඔමින්තාං ආණ්ඩුවේ 4වැනි හමුදාවේ අණදෙන්නා වූ වොං චුං-ලියන්, 1947 ජූලි මාසයෙහි නිරිතදිග ශාන්ටුං සටන්ව්‍යාපාරයේදී ලැබූ පරාජය නිසා 1947 අගෝස්තුවේදී නිලයෙන් පහ කරනු ලැබී ය. ඊසානදිග චීනයේ කුඔමින්තාං ආණ්ඩුවේ සාම සංරක්ෂණ මූලස්ථානයේ අණදෙන්නා වූ තු යූ-මිං ද ඊසානදිග චීනයේ කුඔමින්තාං මහාසේනාධිනායකයාගේ මූලස්ථානයේ අධ්‍යක්ෂ වූ ශියුං ශි-හුයි ද යන දෙදෙනා ම 1947 ජූනියෙහි මහජන විමුක්ති හමුදාවේ ඊසානදිග ග්‍රීෂ්මසෘතු ප්‍රහාරයේදී එම හමුදාව විසින් බරපතල ලෙස පරාජය කරනු ලැබූ නිසා, නිලයෙන් පහ කරනු ලැබූහ. කුඔමින්තාං ආණ්ඩුවේ 11වැනි යුද්ධ කලාපයේ අණදෙන්නා වූ සුන් ලියන්-චුං 1947 ජූනියෙහි චිං-ත්සාන් සටන්ව්‍යාපාරයේදී ත් පාඕතිං නුවරට උතුරෙන් පිහිටි ශුශුයි ප්‍රදේශයෙහි සටන්ව්‍යාපාරයේදී ත් ලැබූ පරාජයන් නිසා, පාඕතිං නුවර අස්වැසීමේ මූලස්ථානයේ අධ්‍යක්ෂ පදවියට පහත දමනු ලැබී ය. චියාං කායි-ශෙක්ගේ මහ සෙනෙවි මණ්ඩලයේ ප්‍රධානයා වූ චෙන් චෙං ඔහු ශාන්ටුං පළාතෙහි විධානය කළ සටන්ව්‍යාපාර පිටපිට ම පරාජය වූ නිසා 1947 අගෝස්තුවෙහි ඊසානදිග චීනයේ අග්‍රාණ්ඩුකාර පදවියට පහත දමනු ලැබී ය.

[3] මෙයින් සඳහන් වන්නේ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් 1946, මැයි 4වැනි දින නිකුත් කරනලද "ඉඩම් ප්‍රශ්නය ගැන නිර්දේශය"යි. ජපනුන් යටත් වූ පසු, ගොවියන් මහත් ඕනෑකමින් ඉඩම් ඉල්ලා සිටි නිසා, මධ්‍යම කාරකසභාව විරුද්දකම් පෑමේ යුද්ධය පැවති කාලයේ තිබුණු ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කිරීමට, ඒ කියන්නේ, බදු සහ පොලී අඩු කිරීමේ ප්‍රතිපත්තිය ඉඩම්හිමියන් සතු ඉඩම් බලෙන් අල්ලාගෙන ඒවා ගොවියන් අතර බෙදා දීමේ ප්‍රතිපත්තිය බවට වෙනස් කිරීමට, තීරණය කළේ ය. "මැයි 4 නිර්දේශය" මේ වෙනස් කිරීම සලකුණු කළේ ය.

[4] චීන කොමියුනිස්ට් පක්ෂයේ ජාතික ඉඩම් සාකච්ඡාසභාව 1947 සැප්තැම්බර් මාසයේදී හෝපෙයි පළාතේ පිංශාන් කෝරළයේ ශිපායිපෝ ගමේදී පවත්වනලදී. සාකච්ඡාසභාව විසින් සැප්තැම්බර් 13 වැනි දින සම්මත කරනලද චීනයේ සංක්ෂේප ඉඩම් නීතිය චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් 1947, ඔක්තෝබර 10 වැනි ද ප්‍රසිද්ධ කරනලදී. එය මතු දක්වන දේ නියම කළේ ය:

> රදළ සහ අර්ධ-රදළ සූරාකෑමේ ඉඩම් ක්‍රමය නැති කොට වගා කරන්නන්ට ඉඩම් දීමේ ක්‍රමය ක්‍රියාවේ යොදන්න.

> ගම් වල තිබෙන ඉඩම්හිමියන් සතු ඉඩම් සහ රජයේ ඉඩම් සියල්ල ප්‍රාදේශීය ගොවි සංගම් වලට පවරා ගෙන, එහි තිබෙන සෙසු සියලු ඉඩම් ද සමග, ස්ත්‍රී-පුරුෂභාවය නො තකා මුළු ගම්බද ජනගහණය අතර සම සම ව බෙදිය යුතු ය.
>
> ගම් වල ගොවි සංගම් ඉඩම්හිමියන් සතු බර අදින සතුන්, ගොවි මෙවලම්, ගෙවල්, ධාන්‍ය සහ වෙනත් දේපොළ පවරා ගෙන, පොහොසත් ගොවියන් සතු එබඳු දේපොළ වලින් අතිරික්ත කොටස් බලෙන් ලබා ගෙන, මේ සියලු දේපොළ ඒවා උවමනා කරන ගොවියන් සහ සෙසු දුප්පත් මිනිසුන් අතර බෙදා දිය යුතු ය, ඉඩම්හිමියන්ට ද ඒ තරම් ම කොටසක් වෙන් කර දිය යුතු ය.

මෙසේ සංක්ෂේප ඉඩම් නීතිය 1946යේ "මැයි 4 නිර්දේශයෙහි" පණවා තිබෙන "ඉඩම්හිමියන් සතු ඉඩම් බලෙන් අල්ලාගැනීමේ සහ ඒවා ගොවියන් අතර බෙදා දීමේ" මූලධර්මය ස්ථිර කළා පමණක් නො ව, ඇතැම් ඉඩම්හිමියන් ගැන පමණට වඩා සැලකිල්ලක් දක්වූ ඒ නිර්දේශයෙහි තිබුණු අනූනභාවයෙන් තොර බව ද හරිගැස්සුවේ ය.

[5] අනතුරු ව ක්‍රියාත්මක කරගෙන යන අතර චීනයේ සංක්ෂේප ඉඩම් නීතියේ පණවා තිබුණු ඉඩම් සම සම ව බෙදා දීමේ ක්‍රමයෙහි යම් යම් වෙනස්කම් ඇති කරනු ලැබී ය. රදළ ක්‍රමය ඒ වන විට පෙරළා දමා තිබුණු පරණ සහ අඩක් පරණ නිදහස් ප්‍රදේශ වල, තවදුරට ත් ඉඩම් සම සම ව බෙදීමක් නො කරනු ලැබේ ය'යි ද, එහෙත් වැඩිපුර තිබෙන අය ගෙන් රැගෙන හිඟයක් තිබෙන අයට දීමේ ත්, වඩා හොඳ ඉඩම් ඇති අය ගෙන් රැගෙන වඩා නරක ඉඩම් ඇති අයට දීමේ ත් ක්‍රමය මඟින්, නැවත එකලසක් කිරීම තුළින් එතෙක් රදළ වියගස සම්පූර්ණයෙන් අහකට ඇද දමා නො සිටි දිළිඳු ගොවියන්ට සහ ගොවි කුලීකරුවන්ට, තත්වයන් අනුව අවශ්‍ය වුව හොත්, ඉඩම් සහ සෙසු නිෂ්පාදන මාර්ග එක්තරා ප්‍රමාණයක් දිය යුතු ය'යි ද, ඒ අතර මැද ගොවියන්ට සාමාන්‍ය දිළිඳු ගොවියාට තිබෙනවාට වඩා ඉඩම් තබා ගන්නට ඉඩ දෙනවා ඇතැ'යිද 1948 පෙබරවාරියෙහි චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව ස්වකීය "පරණ සහ අඩක්-පරණ ප්‍රදේශ වල ඉඩම් ප්‍රතිසංස්කරණය ත් පක්ෂය තහවුරු කිරීම ත් පිළිබඳ වැඩය ගැන නිර්දේශයෙහි" පැහැදිලි කළේ ය. රදළ ක්‍රමය එතෙකුත් පැවති ප්‍රදේශ වල, සම සම ව බෙදීම ප්‍රධාන වශයෙන් ඉඩම්හිමියන්ගේ ඉඩම් සහ දේපොළ වලට ත් පරණ-කාලේ පොහොසත් ගොවියන්ගේ අතිරික්ත ඉඩම් සහ දේපොළ වලට ත් සීමා කරනු ලැබී ය. සියලු ප්‍රදේශ වල, නැවත එකලසක් කිරීමේ කාරිය පිණිස මැද ගොවියන්ගේ ත් අළුත්-තාලේ පොහොසත් ගොවියන්ගේ ත් අතිරික්ත ඉඩම් සහ දේපොළ ගැනීමට අවසර තිබුණේ එසේ එකලසක් කිරීම ඇත්ත වශයෙන් ම අවශ්‍ය වී නම් සහ අයිතිකරුවන් ඇත්ත වශයෙන් ම කැමැත්ත දුන්නේ නම් පමණකි. අළුත් නිදහස් ප්‍රදේශ වල ඉඩම් ප්‍රතිසංස්කරණයේදී, කිසි ම මැද ගොවියකු ගෙන් කිසි ම ඉඩමක් නො ගත යුතු විය.

[6] චීනයේ ඉඩම් ප්‍රතිසංස්කරණයෙහි පොහොසත් ගොවියන් පිළිබඳ ප්‍රශ්නය ඇගේ විශේෂිත ඉතිහාසීය සහ ආර්ථික තත්වයන් කෙරෙන් පැනනැඟුණු විශේෂ

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

- කෘතිය: පොතට වහල් වීමට විරුද්ධ වන්න
- කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
- ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ, කොළඹ
- පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
- ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
- පිටු ගණන: 31
- භාෂා මාධ්‍ය: සිංහල
- ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com